ජාතික ඉතිරිකිරීමේ බැංකුව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ("බැංකුව") සහ බැංකුවේ හා එහි පරිපාලිතයේ සමාගම්වල ("සමූහය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව සහ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, බැංකුවේ හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය.කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව සහ සමූහය ක්‍රියා කර ඇති බව

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව සහ සමූහය කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව බැංකුව සහ සමූහය ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පෙර වර්ෂයේ පැවති රු. මිලියන 269.328 හා සැසඳීමේදී බැංකුවේ අන්තර් ශාඛා ශේෂය රු. මිලියන 143.231 ක් ව පැවතුණි. මෙම ශේෂය, ශාඛා ලෙජර හා ප්‍රධාන කාර්යාල ලෙජර ගිණුම් කීපයක එකතුවකින් ලබාගනු ලැබේ. මෙම ශේෂයන්ගෙන් කොටසක් වසර ගණනාවක් තිස්සේ නොවෙනස්ව පවතී. කෙසේ වෙතත්, මෙම අන්තර් ශාඛා ශේෂයන් සැසඳීම සඳහා බැංකුව විසින් විධිමත් ක්‍රියාපටිපාටියක් ස්ථාපිත කර නොතිබුණි. ඒ වෙනුවට, පෙර වර්ෂයේ ශේෂය වූ රු. මිලියන 269.328 සඳහා සම්පූර්ණ ප්‍රතිපාදනයක් වෙන් කිරීමට තීරණය කර තිබුණි.	Legacy පද්ධතියේ හිඟ ශේෂයන් ආසන්න වශයෙන් වසර දෙකක් තිස්සේ ඉදිරියට රැගෙන ගොස් ඇති අතර මූල්‍ය හා සැලසුම් අංශය ඒවා සමීපව අධීක්ෂණය කරයි. සැලකිල්ලෙන් පරීක්ෂා කළ පසු, අවශ්‍ය අනුමැති ලබා ගනිමින් මෙම ශේෂ ආදායම් ප්‍රකාශනයට නැවත ලියා ඇතුළත් කෙරේ. 2025 සැප්තැම්බර් 30 දිනට Legacy පද්ධතියේ අන්තර් ශාඛා ශේෂය රු.102,415,543 (බැර ශේෂය) ක් වේ. මෙම ශේෂයන් අත්හිටුවා ඇති අතර, ශාඛා ප්‍රවේශය සීමා කිරීම සඳහා මූල්‍ය අංශයට මාරු කරනු ලැබේ. 2024 සැප්තැම්බර් 18 වන දින නව හර බැංකු පද්ධතියට (Core Banking System) සංක්‍රමණය වීමෙන් පසුව, අන්තර් ශාඛා ඇතුළත් කිරීම් තත්‍ය කාලීනව ස්වයංක්‍රීයව යාවත්කාලීන වේ; එබැවින්, මෙම ශේෂවල කිසිදු වෙනසක් නොමැත.	අන්තර් ශාඛා ශේෂයන් සැසඳීම සඳහා ප්‍රමාණවත් සහ සුදුසු ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කළ යුතුය.

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු දෑ

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ) 2024 දෙසැම්බර් 31 දිනට බැංකුව විසින් ප්‍රදානය කරන ලද මුළු දළ ණය සහ	ප්‍රතිව්‍යුහගත යෝජනාව සඳහා සහ සැලසුම ඉදිරියට ගෙනයාම සඳහා සමාගම විසින් බැංකු දෙකෙන්ම අනුමැතිය ඉල්ලා ඇත. සුදුසු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් උපදෙස් ඉල්ලා ඇත.	ණය ප්‍රදානය කිරීමට පෙර බැංකුව විසින් ගනුදෙනුකරුවන් සම්බනධයෙන් නිසි

	අත්තිකාරම් වටිනාකම රු.මිලියන 561,313 ක් වේ. මුළු ණය සහ අත්තිකාරම් අතරින් රු.මිලියන 3,518 ක් (එ.ජ.ඩො. මිලියන 12.01 කට සමාන) විදේශීය සමාගමකට දුන් ණය සහ ඒ මත ලැබිය යුතු උපචිත පොළිය නියෝජනය කරයි. 2025 මැයි 31 දිනට මෙම විදේශීය ණයෙහි ලැබිය යුතු ශේෂය රු.මිලියන 4,298 ක් විය.		ඇගයීම් සිදු කළ යුතු අතර, එසේම අනාගත පැහැර හැරීම් අවම කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කළ යුතුය. හිඟ ණය අයකරගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතු බවට තවදුරටත් නිර්දේශ කෙරේ.
ආ)	2025 මැයි 31 දිනට මුළු අයවිය යුතු ආයතනික ණය ශේෂය රු. මිලියන 72,250 ක් වූ අතර එයින් රු. මිලියන 5,777 ක් හෙවත් සියයට 8 ක් අක්‍රීය ණය කාණ්ඩය යටතේ වර්ගීකරණය කර තිබුණි. ඉහත අක්‍රීය ණය ශේෂය අතරින් සියයට 74 ක් ඉහත විදේශීය සමාගමට ප්‍රදානය කළ ණය නියෝජනය කරන අතර, සියයට 20 ක් භාණ්ඩාගාර ඇපකර මගින් සුරක්ෂිත කරන ලද රජයට සම්බන්ධ සමාගමකට ප්‍රදානය කළ ණයක් නියෝජනය කරයි.	අක්‍රීය ණය සඳහා අයකර ගැනීමේ ක්‍රියාමාර්ග දැනට සිදු කෙරෙමින් පවතී. අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල තත්වය පහත දැක්වේ. **බිම්පුත් මූල්‍ය සමාගම** ණය දෙකම සඳහා ඉල්ලීම් ලිපි (Letters of Demand) සේවාදායකයා වෙත යවා ඇත. සේවාදායකයාට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා පැමිණිල්ලක් දැනට රාජ්‍ය කවුන්සිලය (State Council) විසින් සකස් කරමින් පවතී. **ටෙක්නෝපාර්ක් සංවර්ධන සමාගම (ප්‍රයිවට්) ලිමිටඩ්** ටෙක්නෝපාර්ක් ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීමට 2025 ජුලි 28 දින මුදල් අමාත්‍යාංශයේදී රැස්වීමක් පැවැත්වුණි. ණය පහසුකම සම්පූර්ණයෙන්ම පියවීමට අමාත්‍යාංශය තීරණය කර ඇති බව රැස්වීමේදී දැනුම් දෙන ලද අතර අයවීමට ඇති මුලු මුදල් පිළිබඳ විස්තර ඉල්ලා සිටින ලදී. 2025 දෙසැම්බර් 01 දින ණය පහසුකම සම්පූර්ණයෙන්ම පියවනු ඇති බව දන්වා ඇත. **මවුන්ට් ලැවීනියා හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්** බැංකු විසින් පත් කරන ලද නීති උපදේශකයා සමග උපදේශනයක් 2025 ඔක්තෝම්බර් 3 දින අනෙකුත් බැංකු සමග පැවැත්වුණි. සාකච්ඡා කිරීමෙන් පසු ගනුදෙනුකරුට බලපෑම් කිරීමට බැංකුව කළ ඉල්ලීම සලකා බලන ලදී. ණය ආපසු අයකරගැනීම සඳහා පරාටේ (Parate) නීතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලෙස නීති උපදේශකවරයා උපදෙස් ලබා දී තිබුණි. ආර්පී අයි (RPI) (ප්‍රයිවට්) ලිමිටඩ් (අ ඡේදය යටතේ දක්වා ඇති පරිදි)	ණය ප්‍රදානය කිරීමට පෙර බැංකුව විසින් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි ඇගයීම් සිදු කළ යුතු අතර අනාගත පැහැර හැරීම් අවම කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කළ යුතුය.හිඟ ණය අයකරගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතු බවට හා බැංකුවේ අක්‍රීය ණය ශේෂය අවම කළ යුතු බවට තවදුරටත් නිර්දේශ කෙරේ.

ඇ) 2025 මැයි 31 දිනට බැංකුව විසින් ප්‍රදානය කළ රු. මිලියන 5 ට වඩා වැඩි ණය මුදල්වල අයවීමට ඇති ශේෂය රු. මිලියන 100,661.97 ක් විය. ඒ අතරින් රු. මිලියන 88,457.13 ක් ශාඛා විසින් ප්‍රදානය කර තිබූ අතර ඉතිරි රු. මිලියන 12,204.84 ණය අංශය විසින් ප්‍රදානය කර තිබුණි. ප්‍රදානය කළ රු. මිලියන 5 ට වැඩි ණය අතරින් රු. මිලියන 8,099.49 ක් අක්‍රීය ණය කාණ්ඩය යටතේ වර්ගීකරණය කර තිබුණි.

2025 මැයි 31 දිනට රු. මිලියන 5 ට වැඩි හිඟ ණය ශේෂයන් සහ ඒවාට අනුරූප අක්‍රීය ණය ශේෂයන්හි විස්තරයක් පහත පරිදි වේ.

විශ්ලේෂණ කොටස	මුළු අයවීමට ඇති මුදල (රු.)	අයවීමට ඇති අක්‍රීය ණය (රු.)	මුළු ණය අතරින් අක්‍රීය %
ශාඛා අංශය	16,119,743,051	1,156,957,750	7.18
ආයතනික මූල්‍ය අංශය	72,337,389,050	5,865,278,943	8.11
ණය අංශය	12,204,833,843	1,077,244,543	8.83
සමස්තයක් ලෙස බැංකුව	100,661,959,944	8,099,481,235	8.05

ඒ අනුව ශාඛා විසින් ප්‍රදානය කර තිබූ රු. මිලියන 5 ට වැඩි ණය අතරින් රු. මිලියන 1,156 ක් අක්‍රීය ණය කාණ්ඩය යටතට වැටේ. මෙය ශාඛා අංශයේ කළඹෙන් සියයට 7.18 ක් සහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද රු. මිලියන 5 ට වැඩි මුළු ණයවලින් සියයට 1.15 ක් නියෝජනය කරයි.

කෙසේ වෙතත්, 2025 සැප්තැම්බර් 30 වන විට, ශාඛා අංශය විසින් ප්‍රදානය කරන ලද රු. මිලියන 5 ට වැඩි ණයවල අයවීමට ඇති ශේෂය රු. මිලියන 16,332.85 ක් වන අතර, එම කාණ්ඩයේම අක්‍රීය ණයවල අයවීමට ඇති ශේෂය රු. මිලියන 937.537 දක්වා අඩු වී ඇත. මෙය, ශාඛා අංශ ණය කළඹෙන් සියයට 5.74 ක් සහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද රු. මිලියන 5 ට වැඩි මුළු ණයවලින් සියයට 0.97 ක් නියෝජනය කරයි.

තවද, අක්‍රීය ණය ශේෂයන් තවදුරටත් අඩු කිරීම සඳහා, බැංකුව එහි අයකරගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

අ) 2025 ඔක්තෝම්බර් 09 දිනැති සාමාන්‍යාධිකාරීවරයාගේ චක්‍රලේඛ අංක 1140/2025 අනුව, බැංකුව විසින් ලබා දී ඇති පහසුකම් අක්‍රිය නොවී නිසි ලෙස සේවා සපයන බව සහතික කිරීම සඳහා බැංකුව එහි අයකර ගැනීමේ ක්‍රියාපටිපාටි විධිමත් කර ඇත.

ආ) 2024 දෙසැම්බර් 23 දිනැති සාමාන්‍යාධිකාරීවරයාගේ චක්‍රලේඛ අංක 94/2024 අනුව, අයකර ගැනීමේ කාර්යයන් සඳහා සහාය වීමට ශාඛාවලට අනුයුක්ත අලෙවිකරණ නිලධාරීන් යොදවා තිබුණි.

ඇ) 2024 සැප්තැම්බර් 27 දිනැති අංක 1106/2024 දරන සාමාන්‍යාධිකාරී චක්‍රලේඛය හරහා, ක්‍රමවත් ලෙස ණය ආපසු ගෙවන්නන් සඳහා විශේෂ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් බැංකුව විසින් හඳුන්වා දී ඇත.

ඉ) 2025 දී බෙලිඅත්ත අයකිරීමේ මධ්‍යස්ථානය අතිරේක කාර්ය මණ්ඩලයක් වෙන් කිරීම හරහා ශක්තිමත් කරන ලද අතර, අක්‍රීය

ණය ප්‍රදානය කිරීමට පෙර බැංකුව විසින් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි ඇගයීම් සිදු කළ යුතු අතර අනාගත පැහැර හැරීම් අවම කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කළ යුතුය.හිඟ ණය අයකරගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතු බවට හා බැංකුවේ අක්‍රීය ණය ශේෂය අවම කළ යුතු බවට තවදුරටත් නිර්දේශ කෙරේ.

ණය (NPL) අඩු කිරීම අරමුණු කරගත් උත්සාහයන් තීව්‍ර කිරීම සඳහා එහි ක්‍රියාකාරකම් සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්) ගේ අධීක්ෂණය යටතට ගෙන ඒමෙන් එහි කාර්යයන් විධිමත් කරන ලදී.
ඊ) “ අලාභය ” කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලද අක්‍රීය ණය අයකරගැනීම කඩිනම් කිරීම සඳහා ණය එකතු කිරීමේ සමාගම් හතරක සේවාවන් ලබාගැනීම බැංකුව විසින් ආරම්භ කර ඇත.
2025 සැප්තැම්බර් 30 දිනට බැංකුවේ සමස්ත අක්‍රිය ණය අනුපාතය සියයට 5.65 ක් වූ අතර, එය කර්මාන්තයේ සාමාන්‍යයට වඩා අඩුය.

1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ) 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 47 වන වගන්තිය	හිමිකම් නොපෑ තැන්පතු සංචිත ගිණුම (Unclaimed Deposits Reserve Account) හරහා බැංකුව විසින් ගණුදෙනුකරුවන්ට කරනු ලබන ගෙවීම් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපූරණය කළ යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 විගණන දිනය වන විට, 2024 වර්ෂය දක්වා ගණුදෙනුකරුවන්ට ගෙවන ලද මුළු රු.මිලියන 193.452 ක් තවමත් ප්‍රතිපූරණය කර නොතිබුණි.	2025 මාර්තු 20 දිනැති ලිපියෙන් බැංකුව විසින් ලැබිය යුතු මුදල ඉල්ලුම් කර ඇත. 2025 ජුනි 06 දින මහා භාණ්ඩාගාරය විසින් වැඩිදුර විස්තර ඉල්ලූ අතර, ඒවා 2025 ජුලි 30 දින ඉදිරිපත් කර ඇත. 2025 සැප්තැම්බර් 30 දිනැති ඔවුන්ගේ ලිපියෙන්, නැවත සක්‍රිය කරන ලද අක්‍රිය ශේෂයන් සඳහා එක් එක් ගනුදෙනුකරුවන්ගේ තොරතුරු ලබා දෙන ලෙස භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටි අතර, බැංකුව විසින් තොරතුරු සැකසීමේ ක්‍රියාවලියේ යෙදී සිටී.	බැංකුව විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.
ආ) බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 අංක 16 දරන විධානයේ 1 වන උපලේඛනය			
(i) 4.3 වගන්තිය	බැංකුව තුළ මණ්ඩලය විසින් අනුමත කරන ලද	තීරණාත්මක තොරතුරු පද්ධති ලැයිස්තුව ඇතුළත්	බැංකුව විසින් 2021 අංක 16 දරන ශ්‍රී ලංකා මහ

	තීරණාත්මක තොරතුරු පද්ධති (Critical Information Systems) ලැයිස්තුවක් නොතිබුණි.	පත්‍රිකාවක් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත ඉදිරිපත් කර ඇත.	බැංකු විධානයේ අදාල වගන්තියට අනුකූල විය යුතුය.
(ii) 4.3.3 වගන්තිය	සියලුම තීරණාත්මක නොවන තොරතුරු පද්ධති අවම වශයෙන් සෑම වසර දෙකකට වරක්වත් සමාලෝචනය කළ යුතු අතර, තීරණාත්මක නොවන තොරතුරු පද්ධති ලෙස බැහැර කිරීම සඳහා ඇති තාර්කිකත්වය පැහැදිලි කරමින් ප්‍රමාණවත් විස්තර සහිතව ලේඛනගත කළ යුතු වුවද, එවැනි සමාලෝචනයක් මෑතකදී සිදු කර නොතිබුණි.	2025 පළමු කාර්තුව තුලදී තීරණාත්මක තොරතුරු පද්ධති හඳුනාගෙන මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. 2026 පළමු කාර්තුව තුල තීරණාත්මක නොවන තොරතුරු පද්ධති සමාලෝචනය කෙරේ.	බැංකුව විසින් 2021 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු විධානයේ අදාල වගන්තියට අනුකූල විය යුතුය.
(iii) 4.6.6 වගන්තිය	බැංකුවේ BIRMC විසින් අනුමත කරන ලද තෙවන පාර්ශවීය සේවා සපයන්නන් සහ නියෝජිතයින් විසින් සිදු කරනු ලබන සේවාවන්හි තීරණාත්මකභාවය සහ සංවේදීතාවයට සමාන වන එම තෙවන පාර්ශවීය සේවා සපයන්නන් සහ නියෝජිතයින් සඳහා අවදානම් සහ පාලන ස්වයං තක්සේරු ක්‍රියාවලීන් ඇතුළුව ප්‍රමාණවත් තාක්‍ෂණික අවදානම් කළමනාකරණය සහ අධීක්ෂණ පියවරයන් බැංකුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.	තීරණාත්මක තොරතුරු පද්ධති සඳහා සහාය දක්වන සේවා සැපයුම්කරුවන් සම්බන්ධයෙන් අවදානම් තක්සේරු කිරීම් සහ නිසි පරික්ෂාවන් (Due Dilligence) සමඟ BIRMC අනුමැතිය ලබා ගනු ලැබේ.	බැංකුව විසින් 2021 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු විධානයේ අදාල වගන්තියට අනුකූල විය යුතුය.
(iv) 5.1.2 වගන්තිය	තීරණාත්මක පද්ධතිවලට අදාළ කාර්ය මණ්ඩලය, නියෝජිතයින් සහ තෙවන පාර්ශවීය සේවා සපයන්නන් ඇතුළු අවශ්‍ය පුද්ගලයින් අවම වශයෙන් වාර්ෂිකව තොරතුරු ආරක්ෂණ දැනුවත්	නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සමඟින්, තොරතුරු ආරක්ෂාව සඳහා සහතික කිරීමේ පරීක්ෂණයක් සකස් කර මාර්ගගතව පවත්වනු ලැබේ. 2026 පළමු කාර්තුවේ සිට ආරම්භ වන දැනුවත්	බැංකුව විසින් 2021 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු විධානයේ අදාල වගන්තියට අනුකූල විය යුතුය.

කිරීමේ පුහුණුව මත පදනම් වූ අභ්‍යන්තර සහතික කිරීමේ පරීක්ෂණයක් සම්පූර්ණ කළ යුතු වුවද, බැංකුව මෙම අවශ්‍යතාවය සපුරාලීමට පියවර ගෙන නොතිබුණි.	කිරීමේ පුහුණු වැඩසටහනකට අනුව මෙය සිදු කළ යුතුය.

1.8 තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලන

2024 සැප්තැම්බර් 13 දින සිට බලපැවැත්වෙන පරිදි බැංකුව විසින් එහි පැරණි පද්ධතිය (Legacy) හර බැංකු පද්ධතියට ඉහළ නංවා ඇති අතර, නව හර බැංකු පද්ධතියේ (CBS) දත්ත සංක්‍රමණ සමාලෝචනය, තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලන සමාලෝචනය සහ තීරණාත්මක තොරතුරු තාක්ෂණ යෙදුම් පාලන සමාලෝචනය සිදු කිරීම සඳහා පුද්ගලික විගණකවරයෙකු පත් කරන ලදී. සමාලෝචනය අතරතුර පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	**ගණුදෙනුකරු කළමනාකරණය**		
	(i) දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයන් Politically Exposed person (PEP) පරීක්ෂාව සහ ලේඛන කළමනාකරණ පද්ධතිය මූලික බැංකු පද්ධතියට (CBS) ඒකාබද්ධ කර නොමැත.	ප්‍රායෝගික සහ තාක්ෂණික සීමාවන් හේතුවෙන් ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) මූලික බැංකු පද්ධතියට (CBS) ඒකාබද්ධ කර නොමැත. PEP සඳහා පොදුවේ පිළිගත් ලැයිස්තුවක් නොමැත. PEP පරීක්ෂාව සහ අඛණ්ඩ ගනුදෙනු අධීක්ෂණය AML පද්ධතිය (COMPASS) හරහා සිදු කෙරේ. COMPASS හි දෛනික ගනුදෙනු පරීක්ෂාව මඟින් ඕනෑම අසාදු ලේඛනගත හෝ අධි අවදානම් ගිණුම් වහාම හඳුනාගෙන අනුකූලතා ක්‍රියා පටිපාටිවලට අනුකූලව අවහිර කරනු ලැබේ.	සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය සහ විධිමත් පාලන පරිසරයක් සහතික කිරීම සඳහා CBS, ලේඛන කළමනාකරණ පද්ධතිය සහ PEP පරීක්ෂණ ක්‍රියාවලිය අතර ඒකාබද්ධ කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට බැංකුව අවශ්‍ය පියවර ගැනීම නිර්දේශ කෙරේ.
	(ii) ඉහළ අවදානම් සහිත ගණුදෙනුකරුවන් සඳහා AML සත්‍යාපනය, KYC සමාලෝචනය සහ අනුකූලතා අනුමැතියකින් තොරව ගණුදෙනුකරුවන් නිර්මාණය කිරීම සහ ගිණුම් විවෘත කිරීම සිදු කළ හැකිය.	ගනුදෙනුකරුගේ වාර්තා නිර්මාණය කිරීමට පෙර AML පරීක්ෂාවන් සම්පූර්ණ කිරීම අවශ්‍ය වන අතර, ගනුදෙනුකරුගේ හෝ ගිණුම් වාර්තා සක්‍රිය කිරීමට පෙර KYC සහ AML සත්‍යාපනය ඇතුළුව අවශ්‍ය සියලුම ගනුදෙනුකරුගේ නිසි පරීක්ෂාවන් (Due Dilligence) සම්පූර්ණ කර ඇති බව සහතික කිරීමට ශාඛාවලට උපදෙස් දෙනු ලැබේ.	AML සත්‍යාපනය, KYC සමාලෝචනය සහ අනුකූලතා අනුමැතිය සම්පූර්ණ නොකර ගනුදෙනුකරුවන් නිර්මාණය කිරීම සහ ගිණුම් විවෘත කිරීම සිදු කළ නොහැකි බව සහතික කිරීම සඳහා බැංකුව CBS තුළ අනිවාර්ය පද්ධති පාලනයන් ක්‍රියාත්මක කළ යුතුය.
	iii) ආයතනික ණය සම්බන්ධයෙන් සමාගම් බඳු අංක	CBS හි "Legal ID Document" ක්ෂේත්‍රය යටතේ සමාගම් ලියාපදිංචි අංක සහ උප්පැන්න	අනන්‍ය නොවන උප්පැන්න සහතික සහ

සහ ලියාපදිංචි අංක හා බාලවයස්කාර ගිණුම් සම්බන්ධයෙන් උප්පැන්න සහතික අංක අනුපිටපත් (duplicate) විය හැක.	සහතික අංක පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාවේ උප්පැන්න සහතික අංක අද්විතීය හඳුනාගැනීම් නොවේ, මන්ද ඒවා විමධ්‍යගත බලධාරීන් විසින් නිකුත් කරනු ලැබේ. එබැවින්, අනුපිටපත් කිරීම සිදුවිය හැකිය. ඒ හා සමානව, තනි හිමිකාරත්වයන්, හවුල්කාරිත්වයන්, සමාගම්වල ව්‍යාපාර ලියාපදිංචි අංක එකම Legal ID ක්ෂේත්‍රයේ භාවිතා වන බැවින් ව්‍යාපාර ලියාපදිංචි අංකය අනුපිටපත් කිරීමේ හැකියාවක් ඇත. එබැවින්, මෙම ක්ෂේත්‍රය නිර්මාණය කර ඇත්තේ අනුපිටපත් තනි පුද්ගල නොවන ගනුදෙනුකරුවන් ඇතුළත් කිරීම සඳහා ඉඩ සැලසීමටයි. උප්පැන්න සහතිකය සහ ව්‍යාපාර ලියාපදිංචි අංක අනුපිටපත් කළ හැකි වුවද, CBS හි සෑම ගනුදෙනුකරුවෙකු සඳහාම අනන්‍ය පාරිභෝගික හඳුනාගැනීමේ අංකයක් ඇත.	ව්‍යාපාර ලියාපදිංචි අංක සම්බන්ධයෙන් ප්‍රායෝගික සීමාවන් හඳුනා ගන්නා අතරම, අනුපිටපත් හෝ වැරදි පාරිභෝගික වාර්තා අවදානම අවම කිරීම සඳහා අතිරේක වලංගුකරණ ස්ථර හෝ ද්විතියික හඳුනාගැනීම් හඳුන්වා දීම පිළිබඳව බැංකුව විමර්ෂණය කළ යුතුය.
iv) අත්සන් කාඩ්පත් සහ ඡායාරූප ලබා ගැනීම අනිවාර්ය නොවේ.	සියලුම නව ගනුදෙනුකරුවන් ඇතුලත් කර ගැනීමේ ක්‍රියාවලියට අනුව අත්සන සහ ඡායාරූප ලබා ගැනීම අනිවාර්ය වේ. CBS මඟින් පාරිභෝගික අත්සන් සහ ඡායාරූප ග්‍රහණය කිරීමට පහසුකම් සපයන අතර පාරිභෝගික ඡායාරූප සහ අත්සන ග්‍රහණය කර ගැනීමේ ක්‍රියාවලිය CBS ක්‍රියාත්මක වීමත් සමඟ ආරම්භ විය. කෙසේ වෙතත්, ඇති වූ සමහර තාක්ෂණික ගැටළු හේතුවෙන්, ක්‍රියාවලිය තාවකාලිකව නවතා දමා ඇති අතර, ඡායාරූප සහ අත්සන ග්‍රහණය කිරීමේ යෙදුමේ අවශ්‍ය සංවර්ධනයන් සිදු කර ඇති අතර අවශ්‍ය පරීක්ෂාවන් සිදු කරමින් පවතී. නොවැම්බර් මාසයේදී පාරිභෝගික ඡායාරූප සහ අත්සන ග්‍රහණය කිරීම නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.	CBS තුළ අත්සන සහ ඡායාරූප ග්‍රහණය කිරීම අනිවාර්ය පාලනයක් බවට පත් කළ යුතු අතර, තවදුරටත් ප්‍රමාදයකින් තොරව ගනුදෙනුකරුවන්ගේ අත්සන් සහ ඡායාරූප ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය නැවත ස්ථාපිත කිරීම බැංකුව සහතික කළ යුතුය.

(ආ) ඉතුරුම්

(i) පාරිභෝගිකයන්ගේ මැන්ඩේටය, ජාතික හැඳුනුම්පත, ලිපිනයන් සනාථ කිරීමේ ලේඛන සහ සමිතිවල වාර්ෂික මහා සභා රැස්වීමේ දිනයන් වැනි අනිවාර්ය ලියකියවිලි සත්‍යාපනය කිරීමෙන් තොරව ගිණුම් නිර්මාණය කිරීමට පද්ධතිය තුල ඉඩ	ගිණුම් විවෘත කිරීමේදී මැන්ඩේටය, ජාතික හැඳුනුම්පත සහ ලිපිනයන් සනාථ කිරීමේ ලේඛන වැනි ලේඛන සත්‍යාපනය කිරීම වගකිවයුතු නිලධාරියකු විසින් සිදු කරනු ලැබේ. CBS හි ගිණුම් නිර්මාණය සඳහා අවසර දීමට පෙර බලයලත් නිලධාරියා විසින් උපයෝගී ලේඛන සමාලෝචනය කර වලංගු කිරීම අවශ්‍ය වේ. CBS හි පාරිභෝගිකයෙකු ඇතුළත් කර ගැනීමේදී ජාතික හැඳුනුම්පත සහ ලිපින සඳහා සාක්ෂි විස්තර අනිවාර්ය වේ.	මැන්ඩේටය, ජාතික හැඳුනුම්පත, ලිපිනයන් සනාථ කිරීමේ ලේඛන සහ සමිති සඳහා වාර්ෂික මහා සභා දිනය ඇතුළු සියලුම අනිවාර්ය ලියකියවිලි සත්‍යාපනය කිරීමෙන් තොරව ගිණුම් නිර්මාණය කළ නොහැකි බව සහතික කිරීම සඳහා

	ලබා දේ.	පරිශීලකයින් මෙම තොරතුරු ඇතුළත් නොකරන්නේ නම් පද්ධතිය තවදුරටත් ඉදිරියට යාමට ඉඩ නොදේ. සමිති සඳහා මහා සභා රැස්වීමේ (AGM) දිනයට අදාළ ක්ෂේත්‍ර පද්ධතිය තුළ තිබේ; කෙසේ වෙතත්, එවැනි තොරතුරු වලංගු කිරීම සහ සත්‍යාපනය කිරීම අතින් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස පවතී, මන්ද මෙම ලේඛන පද්ධතියට ස්වයංක්‍රීයව වලංගු කළ නොහැකි බැවිනි.	බැංකුව CBS තුළ පද්ධති පාලනයන් ශක්තිමත් කළ යුතුය.
(ii)	පාස්පොත සහ ප්‍රකාශන අංශ පවතින නමුත් භාවිතයට නොගනී.	පවත්නා මෙහෙයුම් ක්‍රියාපරිපාටිවලට අනුව පාස්පොත් සහ තැන්පතු සහතික අතින් නඩත්තු කරනු ලැබේ (Manually). අදාළ අංශ පද්ධතිය තුළ පැවතුනද, භෞතික පාස්පොත් සහ අතින් මුද්‍රණය කරන ලද තැන්පතු සහතික ශාඛාවල සම්මත මෙහෙයුම් පිළිවෙත ලෙස දිගටම පවතී.	ගනුදෙනුකරුවන්ගේ ගිණුම් තොරතුරු කළමනාකරණය ස්වයංක්‍රීය කිරීම සහ විධිමත් කිරීම සඳහා CBS හි ඇති පාස්පොත සහ ප්‍රකාශන කාර්යයන් භාවිතා කිරීමේ ශක්‍යතාව බැංකුව විසින් ඇගයීමට ලක් කළ යුතුය.
(ඇ)	**ටෙලර් මෙහෙයුම්**		
(i)	බාලවයස්කාර ගිණුම් සඳහා ප්‍රතිලෝම ගනුදෙනු (reverse transactions), වෙනම ප්‍රතිලෝම අනුමත කිරීම් (separate reversal approvals) සහ මුදල් ආපසු ගැනීම් සඳහා ප්‍රමාණවත් ගනුදෙනු පාලනයන් නොමැති වීම.	CBS හි ගනුදෙනු ආපසු හැරවීම යනු ආදානකරු (inputter) සහ අනුමතකරන්නා (authorizer) සඳහා වෙනම භූමිකාවන් අවශ්‍ය වන පාලිත පියවර දෙකක ක්‍රියාවලියකි. මෙය රාජකාරි වෙන් කිරීම බලාත්මක කරන අතර අඩු වටිනාකමක් ඇති ඒවා ඇතුළුව ආපසු හැරවීම් ස්වාධීන සමාලෝචනයට සහ අනුමැතියට යටත් වන බව සහතික කරයි. බාලවයස්කාර ගිණුම්වලින් මුදල් ආපසු ගැනීම් NSB පනත යටතේ අවසර දී ඇති අතර එම නිසා බැංකුවේ සමස්ත මුදල් ආපසු ගැනීමේ සීමාවන් සහ පාලනයන් තුළ ක්‍රියාවට නංවනු ලැබේ. ටෙලර් යන්ත්‍රයක් බාලවයස්කාර ගිණුමක් සඳහා මුදල් ආපසු ගැනීමක් ආරම්භ කරන විට, පද්ධතිය හඳුනා ගැනීමට සහාය වීම සඳහා පසුබිම්ගත විස්තර (ගිණුම් වර්ගය, භාරකරුගේ නම, ආදිය) පෙන්වන අතර, බාලවයස්කරුවන් සඳහා භාවිතා කරන භෞතික පාස්පොත වැඩිහිටි පාස්පොත්වලට වඩා වෙනස් වේ. මෙම පාලනයන් අනවසර හෝ නුසුදුසු මුදල් ආපසු ගැනීමේ අවදානම අඩු කරයි.	බාලවයස්කාර ගිණුම්වලින් ආපසු හැරවීමේ ගනුදෙනු සහ මුදල් ආපසු ගැනීම් සඳහා අතිරේක ස්වයංක්‍රීය වලංගුකරණ සහ අනුමත කිරීමේ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමෙන් බැංකුව ගනුදෙනු පාලනය තවදුරටත් ශක්තිමත් කළ යුතුය.

(ii) අභ්‍යන්තර ගාස්තු (උදා: ශේෂ තහවුරු කිරීමේ ගාස්තු) නියමිත ලෙජර ගිණුමට ස්වයංක්‍රීයව සටහන් කිරීම සඳහා පද්ධතියේ කිසිදු ක්‍රියාකාරිත්වයක් නොමැත.	මෙහෙයුම් ක්‍රියාපරිපාටිවල කොටසක් ලෙස ශේෂය තහවුරු කිරීම සහ ඇතැම් අභ්‍යන්තර ගාස්තු මූලික බැංකු පද්ධතියෙන් පිටත සිදු කරනු ලැබේ; එබැවින්, අයකිරීම් සටහන් කිරීම බලයලත් නිලධාරීන් විසින් පද්ධතිය තුළ අතින් (manually) සිදුකරනු කරනු ලැබේ. මෙය දැනට පිළිගත් මෙහෙයුම් ක්‍රමයක් වන අතර රාජකාරි වෙන් කිරීම සහ අතින් බලය පැවරීමේ සමාලෝචනය (manual authorization review) මෙමගින් සිදු වේ. ස්වයංක්‍රීය කළ යුතු ගාස්තු වර්ගයක් තිබේ නම්; සුදුසු අවස්ථාවලදී, බැංකුව ස්වයංක්‍රීයකරණ විකල්ප ඇගයීමට ලක් කරනු ඇත.	ශේෂ තහවුරු කිරීමේ ගාස්තු වැනි අභ්‍යන්තර ගාස්තු, CBS තුළ ස්වයංක්‍රීයව සටහන් කිරීමේ ශක්‍යතාව බැංකුව විසින් තක්සේරු කළ යුතුය.
ඇ) චෙක්පත් මෙහෙයුම්		
පද්ධතියේ, තාවකාලික ගිණුමේ (Suspense Account) එක ගනුදෙනුවට බහු චෙක්පත් අංක ඇතුළත් කිරීමට ඉඩ දෙනු ලැබේ.	තනි ගනුදෙනුවක් සඳහා බහු චෙක්පත් අංක වලට පද්ධතිය ඉඩ නොදේ. කෙසේ වෙතත්, පද්ධතිය මඟින් බහු චෙක්පත් අංක තනි අවිනිශ්චිත ගිණුම් ගනුදෙනුවකට සම්බන්ධ කිරීමට ඉඩ දෙන්නේ බහු චෙක්පත් තනි සටහන් කිරීමකට අදාළ වන නිශ්චිත මෙහෙයුම් අවස්ථා යටතේ පමණි (උදා: කණ්ඩායම් එකතු කිරීම් හෝ ඒකාබද්ධ ඇතුළත් කිරීම්). මෙම ගනුදෙනු සත්‍යාපනය සහ බලය පැවරීමේ පාලනයන්ට යටත්ව පවතින අතර, වගවීම හෝ සොයා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් කිසිදු සම්මුතියක් නොමැති බව සහතික කරයි.	බැංකුව මෙම ක්‍රියාකාරකම් නිසි ලෙස පාලනය වීමට සහ සාධාරණ බව තහවුරු කිරීමට, තාවකාලික ගිණුමේ (Suspense Account) එක ගනුදෙනුවකට බහු චෙක්පත් අංක සම්බන්ධ කිරීමට ඉඩ දෙන පද්ධති සැකසුම සහ සම්බන්ධ මෙහෙයුම් සිද්ධාන්ත විමර්ශනය කළ යුතුය.
ඉ) බැංකු ඇපකර		
(i) පද්ධතිය මගින් සීමා මුදල (limit amount) ශුන්‍ය ලෙස සකසා ගැනීමට ඉඩ සලසයි.	ඇතැම් මෙහෙයුම් අවස්ථාවන්ට ඉඩ සැලසීම සඳහා සීමාව ශුන්‍ය ලෙස සැකසීමට පද්ධතිය ඉඩ දෙයි. කෙසේ වෙතත්, පවතින සීමාව ඉක්මවා යන බැංකු ඇපකරයක් නිර්මාණය කර ඇත්නම්; මෙම තත්ත්වය පිළිබඳව පරිශීලකයාට අනතුරු අඟවමින් ප්‍රතික්ෂේප කරන පණිවිඩයක් පද්ධතිය මඟින් පෙන්වයි. අතිරේකව, සියලුම සීමාවන් නිර්මාණය කිරීම් සහ සංශෝධනයන් නිලධාරි සත්‍යාපනයට සහ අවසරයට යටත් වන අතර, නිසි අනුමැතියකින් හෝ සීමාවන් වලංගු කිරීමකින් තොරව කිසිදු බැංකු ඇපකරයක් නිකුත් නොකරන බව සහතික කරයි.	සීමාව ශුන්‍ය ලෙස සැකසීමට ඉඩ සලසන පද්ධති ආකෘතිය බැංකුව සමාලෝචනය කළ යුතු අතර, විය හැකි අනිසි භාවිතය හෝ දත්ත ඇතුළත් කිරීමේ දෝෂ වැළැක්වීම සඳහා අතිරේක වලංගුකරණය හෝ සීමා කිරීමේ පාලනයන් අවශ්‍ය දැයි තක්සේරු කළ යුතුය.
(ii) කල් ඉකුත් වීමට ආසන්න බැංකු ඇපකර සඳහා	කල් ඉකුත්වීමට ආසන්න බැංකු ඇපකර නිරීක්ෂණය කිරීම සඳහා පද්ධතිය මඟින් ක්‍රියාකාරීත්වය සපයන අතර කල් ඉකුත්වීමට	කල් ඉකුත් වීමට ආසන්න බැංකු ඇපකර සඳහා ස්වයංක්‍රීයව ඇඟවීම් හෝ

පද්ධතිය පරිශීලකයින්ට නිවේදන ජනනය නොකරයි.	දින 15 කට පෙර ජනනය කළ හැකි විශේෂිත වාර්තාවක් හරහා එය සිදු කෙරේ. මීට අමතරව, පද්ධතිය මඟින් කල් ඉකුත් වූ හෝ ඇවර කරන ලද අයිතම පිළිබිඹු කරන CLOSED (LIQ) තත්ත්වය සහිත ඇපකර බැලීමට වෙනම විමසීම් පහසුකමක් ලබා දෙයි. මෙම විශේෂාංග සාමූහිකව ඇපකර කල් ඉකුත් වීමේ සක්‍රීය නිරීක්ෂණය සඳහා සහාය ලබා දෙයි.	දැනුම්දීම් ජනනය කිරීමට හැකි පරිදි පද්ධති ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම පිළිබඳව බැංකුව සලකා බැලිය යුතු බව නිර්දේශ කෙරේ.

ඊ) NOSTRO සැසඳීම

NOSTRO සැසඳීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම අතින් සිදු කෙරේ (Manually). NOSTRO සැසඳීමේ ක්‍රියාවලියට සහාය වීම සඳහා වූ මොඩියුලයක් CBS හි ඇතුළත් වුවද, හඳුනාගත් දෝෂ හේතුවෙන් එය නිවැරදිව ක්‍රියාත්මක නොවේ.	NOSTRO සැසඳීමේ ක්‍රියාවලිය දැනට අතින් සිදු කෙරෙන බව බැංකුව පිළිගනී. CBS හි NOSTRO සැසඳීම සඳහාම වෙන්වූ මොඩියුලයක් ඇතුළත් වුවද, ක්‍රියාත්මක කිරීමේදී ඇතැම් ක්‍රියාකාරී දෝෂ හඳුනා ගන්නා ලදී. මෙම දෝෂ දැනටමත් සැපයුම්කරු වෙත වාර්තා කර ඇති අතර ඒවා විසඳීමේ අපේක්ෂාවෙන් පවතී. ගැටළුව විසඳා මොඩියුලය ස්ථාවර කළ පසු, NOSTRO සැසඳීමේ ක්‍රියාවලිය CBS පද්ධතිය හරහා සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය කෙරේ. මේ අතරතුර, සියලුම NOSTRO ගිණුම් සැසඳීම්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සහතික කිරීම සඳහා ස්ථාපිත අභ්‍යන්තර පාලන ක්‍රියාපරිපාටි සහ අධීක්ෂණ සමාලෝචනය යටතේ අතින් සැසඳීම් දිගටම සිදු කෙරේ.	බැංකුව විසින් CBS හි NOSTRO සැසඳුම් මොඩියුලයේ හඳුනාගෙන ඇති ක්‍රියාකාරී ගැටළු විසඳීම කඩිනම් කිරීමට නිර්දේශ කෙරේ.

උ) ස්ථාවර නියෝග

(i) චෙක්පත් ප්‍රතිලාභියාගේ නම පද්ධතිය තුළ ඇතුළත් කිරීමේදී ප්‍රමාණවත් අක්ෂර පද්ධතිය මඟින් ලබා නොදේ. තවද, මුද්‍රණය කිරීමට පෙර ප්‍රතිලාභියාගේ නම සංස්කරණය කිරීමට පද්ධතිය පරිශීලකයින්ට ඉඩ සලසයි.	චෙක්පතෙහි ප්‍රතිලාභියාගේ නම ඇතුළත් කිරීම සඳහා පද්ධතිය උපරිම අක්ෂර 50 ක් දක්වා ඉඩ සලසයි, එය සාමාන්‍යයෙන් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රමාණවත් වේ. මෙය සාමාන්‍ය මෙහෙයුම්වලට බලපෑමක් ඇති නොකරන පද්ධති සැලසුම් පරාමිතියකි. ප්‍රතිලාභියාගේ නම මෙම සීමාව ඉක්මවා යන දුර්ලභ අවස්ථාවන්හිදී, ශාඛා පරිශීලකයින්ට චෙක්පතෙහි සම්පූර්ණ නම අතින් ලිවිය හැකිය. මුද්‍රණය කිරීමට පෙර ප්‍රතිලාභියාගේ නම සංස්කරණය කිරීමේ හැකියාව පවතින අතර එමඟින් මුද්‍රණ හෝ ආකෘතිකරණ දෝෂ නිවැරදි කිරීමට ඉඩ සැලසෙන අතර, එවැනි සංස්කරණ බලයලත් නිලධාරියාගේ වගකීම යටතේ සිදු කෙරේ.	අතින් මැදිහත් වීමකින් තොරව, චෙක්පත් ප්‍රතිලාභීන්ගේ නම් ග්‍රහණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් අක්ෂර සීමාවන් සහතික කිරීම සඳහා බැංකුව පද්ධති ආකෘතිය සමාලෝචනය කළ යුතුය. අතිරේකව, චෙක්පත් මුද්‍රණය කිරීමට පෙර ප්‍රතිලාභීන්ගේ නම් සංස්කරණය කිරීමට ඉඩ සලසන ක්‍රියාකාරීත්වය සීමා කළ යුතු හෝ වැඩිදියුණු කළ පාලන පියවරයන්ට යටත් කළ යුතුය.

	(ii) පොරොත්තු ස්ථාවර නියෝග (pending STO) අනුමතකරණය පිළිබඳව පද්ධතිය පරිශීලකයාට දැනුම් නොදේ.	දැනට, අනවසර ස්ථාවර නියෝග සඳහාම වූ විශේෂිත වාර්තාවක් නොමැත. කෙසේ වෙතත්, දෛනික ශාඛා-අවසන් පරීක්ෂාවන්හි කොටසක් ලෙස අපේක්ෂිත ස්ථාවර නියෝග අවසරයන් සමාලෝචනය කිරීම සඳහා නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් වලට අනුව, ශාඛා අතින් පාලන ක්‍රියාවලියක් (Manual Control Process) අනුගමනය කරයි. නිසි අවසරයකින් තොරව කිසිදු ස්ථාවර නියෝගයක් ක්‍රියාත්මක නොවන බව මෙයින් සහතික කෙරේ.	පොරොත්තු ස්ථාවර නියෝග අවසර සඳහා ස්වයංක්‍රීය දැනුම්දීම් හෝ ව්‍යාතිරේක වාර්තා ජනනය කිරීම සඳහා බැංකුව පද්ධති ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම නිර්දේශ කෙරේ.
	(iii) ස්ථාවර නියෝග චෙක්පත් මුද්‍රණ ගාස්තු පද්ධතිය හරහා අතින් (Manually) සිදු කෙරේ.	ස්ථාවර නියෝගවලට අදාළ චෙක්පත් මුද්‍රණ ගාස්තු චෙක්පත් නිකුත් කරන අවස්ථාවේදී අතින් අඩු කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය වත්මන් ව්‍යාපාරික අවශ්‍යතාවයන්ට අනුකූල වන අතර ගනුදෙනුව සිදු කරන අවස්ථාවේදී ගාස්තු නිවැරදිව යොදන බව සහතික කරයි. අතින් අයකිරීම් අයදුම් කිරීමේ ක්‍රියාවලියේ අනුකූලතාව සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා ශාඛා වෙත මෙහෙයුම් මාර්ගෝපදේශ නිකුත් කර ඇත.	පද්ධතිය තුළ ස්ථාවර නියෝග චෙක්පත් මුද්‍රණය සඳහා අයකිරීම් ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීමේ ශක්‍යතාව බැංකුව විසින් පරීක්ෂා කිරීමට නිර්දේශ කරනු ලැබේ.
ඌ)	**ආරක්ෂිත තැන්පතු පෙට්ටිය Safety Deposit Box (SDB)**		
	(i) අනුමැතීන්, අවසර දීම් සහ වලංගුකරණයන්හි ප්‍රධාන පාලන පරතරයන් හඳුනා ගැනීම.	SDB වලට අදාළ සියලුම මූල්‍ය සහ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම් (උදා: විවෘත කිරීම්, කුලී එකතු කිරීම්) සඳහා පද්ධතිය තුළ එක් මට්ටමේ අවසරයක් අවශ්‍ය වේ. SDB වසා දැමීමේ ක්‍රියාකාරකම මූල්‍යමය නොවන, පරිපාලනමය කාර්යයකි. පාලනයන් ශක්තිමත් කිරීම සඳහා අතිරේක අවසර ස්ථරයක් අවශ්‍ය දැයි තක්සේරු කිරීම සඳහා මෙම ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ එම සමාලෝචනය මත පදනම්ව අවශ්‍ය වෙනස්කම් ක්‍රියාත්මක කරනු ඇත.	බැංකුව විසින් දැනට පරිපාලනමය ලෙස වර්ගීකරණය කර ඇති (SDB වසා දැමීම වැනි), සියලුම මූල්‍ය සහ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් අවසර සහ වලංගුකරණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමෙන් පද්ධති පාලනය ශක්තිමත් කිරීමට නිර්දේශ කෙරේ.
	(ii) අවශ්‍ය ඇපකරය තිබේදැයි පරීක්ෂා නොකර ආරක්ෂිත තැන්පතු පෙට්ටි විවෘත කිරීමට පද්ධතිය ඉඩ දෙයි. (iii) පද්ධතිය තුළ ආරක්ෂිත තැන්පතු පෙට්ටියක් විවෘත කිරීම සඳහා ඇපකර අරමුදල් අගුලු දැමීම අවශ්‍ය	• පද්ධති සීමාවන් සහ අතින් පාලනය: ඇපකර අරමුදල් ස්වයංක්‍රීයව අවහිර නොකරන හෝ වලංගු නොකරන පද්ධති සීමාවන් පවතින බව අපි පිළිගනිමු. මෙම අවදානම අවම කිරීම සඳහා, ශක්තිමත් අතින් පාලනයක් ක්‍රියාත්මක වේ. • පාලන ක්‍රියාපටිපාටිය: අභ්‍යන්තර චක්‍රලේඛ හරහා සියලුම ශාඛා වෙත බෙදා හරින ලද මෙහෙයුම් උපදෙස්වල, නිලධාරියා SDB	ආරක්ෂිත තැන්පතු පෙට්ටි විවෘත කිරීමට පෙර ඇපකර අරමුදල් වලංගු කිරීම සහ අගුළු දැමීම සඳහා පද්ධති පාලනය ස්වයංක්‍රීය කිරීම පිළිබඳව බැංකුව සලකා බැලිය යුතුය.

නොවේ.	විවෘත කරන අවස්ථාවේදී සම්පූර්ණ ඇපකර මුදල සඳහා ඉතුරුම් ගිණුමේ "අරමුදල් අගුලක්" අතින් ගණනය කර තැබිය යුතු බව පැහැදිලිවම නියම කර ඇත. පද්ධතිය ගනුදෙනුව වළක්වන්නේ නැති නමුත් මෙම අතින් අගුල සිදු කිරීමට අපොහොසත් වීම ස්ථාපිත ක්‍රියා පටිපාටිය උල්ලංඝනය කිරීමකි. • අනෙකුත් වර්ග සඳහා ඇපකර: ස්ථාවර තැන්පතු හෝ ඇපකරයක් ලෙස භාවිතා කරන වෙනත් සහතික සඳහා, භෞතික සුරැකුම්පත් බැංකුව විසින් ඇපයට තබා ගැනීම අවශ්‍ය වන අතර එමඟින් නියත පාලනයක් ලබා දේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 16,285.24 ක ලාභයක් වූ අතර ඊට අනුරූප පෙර වර්ෂයේ ලාභය රු. මිලියන 7,216.48 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 9,068.761 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධාන හේතුව ශුද්ධ පොළී ආදායම රු. මිලියන 43,216.860 කින් වැඩිවීමයි. 2024 වර්ෂය තුළදී, රජයේ සුරැකුම්පත් සහ ණය හා අත්තිකාරම් සඳහා ලද පොළී ආදායම අඩුවීම හේතුවෙන් බැංකුවේ මුළු පොළී ආදායම රු.මිලියන 23,218.95 කින් හෙවත් සියයට 10.23 කින් අඩු වී තිබුණි. තැන්පත්කරුවන් සඳහා ගෙවන ලද පොළී අඩුවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා මුළු පොළී වියදම රු. මිලියන 66,435.82 කින් හෙවත් සියයට 33.66 කින් අඩු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟින් පහත දක්වා ඇත.

විස්තරය	විචලන වටිනාකම වැඩි වීම/(අඩු වීම) (රු . මිලියන)	විචලනය %	විචලනයට හේතුව
ශුද්ධ පොළී ආදායම	43,216.86	146	පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව, පොළී වියදම සියයට 33.65 කින් අඩුවී ඇති අතර එය පොළී ආදායම සියයට 10.23 කින් අඩු වීමට වඩා සැලකිය යුතු ලෙස වැඩිය. වාර්තාකරන කාලසීමාව තුළ පවතින තැන්පතු පොළී අනුපාත පහළ යාම නිසා මෙම පොළී වියදම් අඩු වීම ප්‍රධාන වශයෙන් සිදු විය.
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	474.19	37	මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වුයේ ණය ආශ්‍රිත ගාස්තු මෙන්ම වෙළඳ හා ප්‍රේෂණ සේවාවලින් ලද ආදායමයි.
ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම	198.67	77	වාර්තාකරන කාලසීමාව තුල විදේශ විනිමය මත ප්‍රත්‍යාගණන ලාභය රු.මිලියන 114.08 කින් වැඩි වූ අතර, ලාභාංශ ආදායම රු.මිලියන 57.76

			කින් ඉහළ ගොස් තිබුණි.
හානිකරණ ගාස්තු	6,947.23	163	3 වන අදියර ණය සහ අත්තිකාරම් රු.මිලියන 3,120.50 කින් වැඩිවී තිබූ අතර, භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් රු. මිලියන 4,602.67 ක හානිකරණ ප්‍රතිපාදනයක් හඳුනාගන්නා ලදී.

2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත ආංශික අනුපාත සමග සසඳා පහත දැක්වේ.

විස්තරය	ආංශික අනුපාතය *	බැංකුව	
		2024 %	2023 %
ලාභදායිතා අනුපාත			
ස්කන්ධය මත ප්‍රතිලාභ (ROE)	14.3	18.07	9.36
වත්කම් මත ප්‍රතිලාභ (ROA)	1.6	1.54	0.26
ශුද්ධ පොළී ආන්තිකය	4.6	4.23	1.79
වත්කම් ගුණාත්මක අනුපාතය			
මුළු ණය සහ අත්තිකාරම්වලට ස්ථර 3 ණය අනුපාතය	12.9	5.18	2.41
ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR)			
CAR -ස්ථර I අනුපාතය (අවමය 8.5%)	16.8	23.42	16.91
මුළු CAR අනුපාතය (අවමය 12.5%)	19.9	25.88	19.26

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද තොරතුරුවලින් ආංශික අනුපාත උපුටා ගන්නා ලදී.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පසුගිය වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී බැංකුවේ ස්කන්ධය මත ප්‍රතිලාභ (ROE) අනුපාතය සහ වත්කම් මත ප්‍රතිලාභ (ROE) අනුපාතය පිළිවෙලින් සියයට 8.71 කින් සහ සියයට 1.28 කින් වැඩි වී තිබුණි.

(ii) බැංකුවේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය 2024 දෙසැම්බර් 31 වන දිනට සියයට 6.62 කින් වැඩි වී තිබුණු අතර, එය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වන සියයට 12.5 ඉක්මවා යාමකි.

(iii) 2024 වසරේ බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 2.44 කින් වැඩි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2025 ජුනි 30 දිනට වංචනික ක්‍රියාකාරකම් අවස්ථා 104 කින් බැංකුවට සිදු වූ මුළු අලාභය රු.මිලියන 118.366 ක් වූ අතර එදිනට	කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිදු කරන ලද වංචා වලට අදාළ පාඩු අවම කිරීම සඳහා බැංකුව විසින් පහත පියවරගෙන ඇත.	වංචනික ක්‍රියාකාරකම් වලක්වා ගැනීමට සහ ඒවා අඛණ්ඩව

රු.මිලියන 74.490 ක අයකර නොගත් ශේෂයක් ඉතිරිව පවතී. i) කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිදු කර තිබූ මුළු වංචනික සිද්ධීන් දහහතරක (14) ප්‍රතිඵලයක් ලෙස බැංකුවට සිදු වූ අලාභය රු.මිලියන 84.84 ක් විය. 2025 ජුනි 30 වන විට, අයකර නොගත් ශේෂය රුපියල් මිලියන 46.68 ක් වූ අතර, එදිනට එය මුළු අලාභයෙන් සියයට 55 ක් නියෝජනය කරයි.	• වංචා සිදු කළ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර පොලිස් පැමිණිලි ගොනු කර ඇත. • අදාළ පාඩු අයකර ගැනීම සඳහා බැංකුව විසින් අධිකරණ නඩු පවරා ඇත. • බැංකුවේ වන්දි රක්ෂණ ඔප්පුව මගින් ආවරණය වන වංචා හේතුවෙන් සිදු වූ පාඩු අයකර ගැනීම සඳහා රක්ෂණ හිමිකම් ගොනු කර ඇත.	නිරීක්ෂණය කිරීමට බැංකුව ශාඛා මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කළ යුතුය.
ii) 2021 සහ 2024 අතර කාලය තුළ සිදු වූ ATM කාඩ්පත් වංචා අවස්ථා 49 ක් වේ. මෙයින් අවස්ථා 39 ක්, ගෙවීම් යෙදුමක් හැක් කිරීම හරහා ලබාගත් කාඩ්පත් තොරතුරු භාවිතා කරමින් අන්තර්ජාල සාප්පු සවාරි හරහා තෙවන පාර්ශවයන් විසින් සිදු කර තිබුණු අතර එහි සමස්ත අලාභය රුපියල් මිලියන 3.22 කි. විගණිත දිනය වූ 2025 ජුනි 30 දින දක්වා හැක් කිරීම් ආශ්‍රිත වංචනික සිද්ධීන් 39 ක් සඳහා කිසිදු රක්ෂණ වන්දියක් ලැබී නොතිබුණි.	රක්ෂණ හිමිකම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. අදාළ අයිතම බැංකුව විසින් පවරා ගන්නා ලද අතර, බේරුම්කරණයක් සඳහා රක්ෂණ සැපයුම්කරු සමඟ සාකච්ඡා සිදු වෙමින් පවතී.	
iii) තවද, මෙම වංචනික ක්‍රියාකාරකම්වලට වසර පහකට පෙර සිදු වූ සිදුවීම් 30 කින් සිදු වූ පාඩු ඇතුළත් වන අතර, 2025 ජුනි 30 වන විට රුපියල් මිලියන 40.48 ක් අයකර නොගෙන ඉතිරිව තිබුණි.	ප්‍රතිචාරය සඳහා කරුණාකර 3.1.i බලන්න.	

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.		
i)	බැංකුවේ තීරණාත්මක මෙහෙයුමක් වන භාණ්ඩාගාර කාර්යය ස්වයංක්‍රියකරණයකින් තොරව දිගටම ක්‍රියාත්මක වේ. කළමනාකාරිත්වය විසින් භාණ්ඩාගාර මෙහෙයුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාවය දී හෝ කඩිනම් කර නොතිබුණි.	බැංකුව විසින් 2024 අගෝස්තු මාසයේදී "පිනැකල් ට්‍රෙෂරි", භාණ්ඩාගාර කළමනාකරණ විසඳුම ප්‍රසම්පාදනය කර ඇත. මූලික කණ්ඩායම් පුහුණුව සහ පරතර විශ්ලේෂණයෙන් පසුව, ක්‍රියාත්මක කිරීම 2025 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා අපේක්ෂිත කාල සීමාව 2026 මාර්තු 31 වේ.	භාණ්ඩාගාර මෙහෙයුම් ස්වයංක්‍රීය කිරීම සහ විධිමත් කිරීම සඳහා පුළුල් භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව ප්‍රමුඛත්වය දිය යුතුය.

ii) මූල්‍ය, මෙහෙයුම්, කීර්තිය, අනුකූලතාව හෝ උපාය මාර්ගික අවදානම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා සැපයීම අරමුණු කරගත් කාර්තුමය “ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක අධීක්ෂණ වාර්තා”, සියයට 40 ඉක්මවන ‘විගණන ගැටළු කළමනාකරණ සහ අනුකූලතා දර්ශක නිරන්තරයෙන් වාර්තා කර ඇති අතර, එය පෙර වර්ෂවල කාර්තු ගණනාවක මෙහෙයුම් අවදානම් නිරාවරණයේ ඉහළ මට්ටමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, දිගුකාලීනව නිරාවරණය වීමෙන් බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවයට සහ මූල්‍ය ස්ථාවරත්වයට අහිතකර ලෙස බලපෑම් කිරීමේ හැකියාව තිබියදීත්, අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය මෙම අධි අවදානම් ක්ෂේත්‍ර ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර නොමැති බව නිරීක්ෂණය විය.

විගණන ගැටළු කළමනාකරණයේ ඉදිරිපත් කර ඇති සංඛ්‍යාලේඛන, විගණන හරහා ශාඛා ආවරණයට අදාළව, කාර්තුමය වශයෙන් පහත වගුවේ සාරාංශගත කර ඇත.

	1 කාර්තුව 2024	2 කාර්තුව 2024	3 කාර්තුව 2024	4 කාර්තුව 2024
කාර්තුවේ අවසාන දිනට පෙර වර්ෂ තුන තුළ සවිස්තරාත්මක විගණනයකට (විස්තීර්ණ විගණනයකට නොවේ) භාජනය නොවූ ශාඛා ගණන	71	66	57	50
කාර්තුවේ අවසාන දිනට පෙර වර්ෂ දෙක තුළ කිසිදු ආකාරයක විගණනයකට භාජනය නොවූ ශාඛා ගණන	62	68	54	28

පසුගිය වර්ෂ තුන තුළ සවිස්තරාත්මක විගණනයකට භාජනය නොවූ ශාඛා සංඛ්‍යාව 2024 පළමු කාර්තුවේදී 71 ක් වූ අතර, එය 2024 හතරවන කාර්තුවේදී 50 දක්වා අඩු විය. එයින් පෙන්නුම් කරන්නේ විගණන හරහා ශාඛා ජාලය පුළුල් ලෙස ආවරණය වී ඇති බවයි. එපමණක් නොව, 2025 දී එම ශාඛා 21 ක් සවිස්තරාත්මක විගණනයකට භාජනය කරන ලදී.

පසුගිය වර්ෂ දෙක තුළ කිසිදු ආකාරයක විගණනයකට ලක් නොවූ ශාඛා සංඛ්‍යාව 2024 පළමු කාර්තුවේදී 62 ක් වූ අතර එය 2024 හතරවන කාර්තුවේදී 28 දක්වා අඩු විය. තවද, එම ශාඛාවලින් 08 ක් 2025 තුළ ආවරණය කරන ලදී.

2025 මාර්තු 04 දින පැවති විගණන කමිටු මණ්ඩල (BAC) රැස්වීමේදී ශාඛා ආශ්‍රිත විගණන 127 ක් (සවිස්තරාත්මක, විස්මිත , ක්‍රියාවලි, තේමාත්මක, T24 පද්ධති පාදක සහ ප්‍රාදේශීය

"ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක අධීක්ෂණ වාර්තා" තුළ පිළිබිඹු වන "විගණන ගැටළු කළමනාකරණය සහ අනුකූලතා" දර්ශක අඛණ්ඩව ඉහළ මට්ටමක පවත්වාගැනීම සඳහා කළමනාකාරිත්වය පියවර ගත යුතුය.

		කාර්යාල විගණන) ආවරණය වන පරිදි 2025 විගණන සැලැස්ම අනුමත කරන ලදී. 2025 මැයි 19 දක්වා දැනටමත් සිදු කර ඇති විගණනවලට අමතරව, ශාඛා බොහොමයක් 2025 විගණන සැලැස්මට ඇතුළත් කර ඇත. සමහර කාර්ය මණ්ඩල සාමාජිකයින් මූලික බැංකුකරණ ව්‍යාපෘතිය සඳහා යොදවා ඇති අතර, ඉහළ කාර්ය මණ්ඩල පිරිවැටුම පසුගිය වසර තුළ ශාඛා ආවරණය නොකිරීමට හේතු විය. කෙසේ වෙතත්, විගණන සහ සුපරීක්ෂාකාරී අංශය T24 පද්ධති පාදක ශාඛා විගණන ආරම්භ කර ඇති අතර, 2025 විගණන සැලැස්මේ සවිස්තරාත්මක විගණන සංඛ්‍යාව වැඩි කර ඇත. තවද, විගණන සහ සුපරීක්ෂාකාරී අංශය විගණන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර, එය අවසන් අදියරේ පවතී. 2025 මාර්තු 04 දින පැවති විගණන කමිටු මණ්ඩල (BAC) රැස්වීමේදී, සවිස්තරාත්මක විගණනයක් මගින් ශාඛා විගණන ආවරණය වර්ෂ තුනකට වරක් සිදු කිරීමට තීරණය කරන ලදී. අභ්‍යන්තර විගණන අංශය ඉදිරියට එවැනි විගණන ආවරණයක් ඉටු කිරීමට සැලසුම් කරයි.	
iii)	බලපත්‍රලාභී බැංකු සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ 2011 අංක 07 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ A හි 2.4 වගන්තියේ දක්වා ඇති පරිදි, මෙහෙයුම් ක්ෂේත්‍රවල අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් නියම කර ඇති මෙහෙයුම් ක්‍රියා පරිපාටි සහ මාර්ගෝපදේශවලට සීමා විය යුතුය. කෙසේ වෙතත්, මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ අනුකූලතාව අඩපණ කරන, නොගැලපෙන අවිනිශ්චිත ගිණුම් සහ අතින් ක්‍රියාවලීන් මත යැපීම තිබියදීත්, කාඩ්පත් මධ්‍යස්ථාන මෙහෙයුම් සඳහා මෙහෙයුම් අත්පොත් සංවර්ධනය කිරීමට බැංකුව පියවර ගෙන නොතිබුණි.	කාඩ්පත් මධ්‍යස්ථාන ක්‍රියාකාරකම් සඳහා පුළුල් මෙහෙයුම් අත්පොතක් 2024 ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, මෑත කාලීන මූලික බැංකු පද්ධති සංක්‍රමණයෙන් පසුව, ඇතැම් කාඩ්පත් මධ්‍යස්ථාන මෙහෙයුම් තවමත් වෙනස්කම් සහ පිරිපහදු කිරීම් වලට භාජනය වෙමින් පවතී. මෙම මෙහෙයුම් වෙනස්කම් අවසන් වූ පසු, සංශෝධිත ක්‍රියා පටිපාටිවලට අනුකූල වන පරිදි අත්පොත සම්පූර්ණයෙන්ම යාවත්කාලීන කෙරේ. මෙහෙයුම් අත්පොත දැන් සමාලෝචනයට ලක්ව ඇත.	ප්‍රමිතිගත, කාර්යක්ෂම සහ හොඳින් පාලනය කළ මෙහෙයුම් සහතික කිරීම සඳහා කාඩ්පත් මධ්‍යස්ථානය සඳහා වන සියලුම වෙනස්කම් ඇතුළත් කරමින් බැංකුව මෙහෙයුම් අත්පොත් සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය.
iv)	ආයතනික මූල්‍ය කාර්යය බැංකුවේ සැලකියයුතු කාර්යයක් වන බැවින් , මෙම කාර්යයේ විගණනය අවම වශයෙන් වාර්ෂිකව සිදුකළ යුතුය. කෙසේ වෙතත්, අවසන් වරට සම්පූර්ණ	2020 වර්ෂයෙන් පසුව, විගණන සහ සුපරීක්ෂණ අංශය ආයතනික මූල්‍ය අංශයට අදාළ විගණන පවත්වා ඇති අතර ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.	බැංකුවේ සමස්ත මෙහෙයුම් සහ අවදානම් පැතිකඩ සඳහා ආයතනික මූල්‍ය ක්‍රියාකාරිත්වයේ

<table>
<tr>
<td></td>
<td>කළ විගණනය 2020 වර්ෂයේදී සිදු කර ඇති අතර 2022/23 වර්ෂ සඳහා කරන ලද විගණනයක් 2024 අගෝස්තු මාසයේදී මණ්ඩල විගණන කමිටුව (BAC) වෙත ඉදිරිපත් කර ඇත.</td>
<td>
<table>
<tr><td>විගණනය</td><td>විගණන කාල සීමාව</td><td>අවසන් විගණන වාර්තාවේ දිනය</td><td>විගණන කමිටු මණ්ඩල පත්‍රයේ දිනය</td></tr>
<tr><td>පසු විපරම් විගණනය</td><td>2021</td><td>2021.11.24</td><td>2021.11.24</td></tr>
<tr><td>විස්තරාත්මක විගණනය</td><td>2022/2023</td><td>2024.05.31</td><td>2024.07.01</td></tr>
</table>
2025 වර්ෂය සඳහා වන විගණනය මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.
</td>
<td>වැදගත්කම සැලකිල්ලට ගෙන, අවම වශයෙන් වර්ෂයකට වරක්වත් මෙම කාර්යය විගණනය කිරීමට නිර්දේශ කෙරේ.</td>
</tr>
<tr>
<td>v)</td>
<td>අවදානම් කළමනාකරණ අංශය විසින් 2024 වර්ෂය සඳහා භාණ්ඩාගාරය, ජාත්‍යන්තර බැංකු ඒකක මෙහෙයුම් සහ කාඩ්පත් මධ්‍යස්ථාන මෙහෙයුම් යන ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍ර සඳහා අවදානම් පාලන ස්වයං තක්සේරු කිරීම් සිදු කර නොතිබුණි.</td>
<td>2024 සැප්තැම්බර් මාසයේදී, බැංකුව නව මූලික බැංකුකරණ විසඳුමකට මාරු වූ අතර එමඟින් පවතින ක්‍රියාවලීන් ප්‍රතිඉංජිනේරුකරණය කිරීම අවශ්‍ය විය. තවද, භාණ්ඩාගාර අංශයේ ඉදිරිපස සහ පසු කාර්යාල දෙකෙහිම අනුයුක්ත කාර්ය මණ්ඩලය භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ නිරත විය. ක්‍රියාවලීන් අවසන් කර නොමැති නිසා සහ ක්‍රියාවලි හිමිකරුවන් එනම්, එම අංශවලට අනුයුක්ත කාර්ය මණ්ඩලය පද්ධති ආශ්‍රිත කටයුතුවල නියැලී සිටි නිසා, මෙම අවස්ථාවේදී අවදානම් පාලන ස්වයං තක්සේරු කිරීම් (RCSA) පැවැත්වීම තාර්කික හා ප්‍රායෝගික නොවීය. මෙය BIRMC වෙත දැනුම් දෙන ලදී.
එබැවින්, අවදානම් පාලන ස්වයං තක්සේරු කිරීම් ක්‍රියාවලිය තුළ, අවදානම් කළමනාකරණ අංශය විසින් පෙර වර්ෂයේ පවත්වන ලද අවදානම් පාලන ස්වයං තක්සේරු කිරීම් නිර්දේශයන්ට අනුකූලතා මට්ටම පමණක් සමාලෝචනය කරන ලදී. අවදානම් කළමනාකරණ අංශය විසින් 2025 වර්ෂය සඳහා ප්‍රකාශිත කාර්යයන්හි ක්‍රියාවලි හිමිකරුවන් සමඟ අවදානම් පාලන ස්වයං තක්සේරු කිරීම් ආරම්භ කර ඇති අතර, BIRMC වෙත වාර්තා වර්ෂය තුළ ඉදිරිපත් කරනු ලැබේ.</td>
<td>මෙහෙයුම් අවදානම් පුළුල් ලෙස හඳුනා ගැනීම සහ ඇගයීම සහතික කිරීම සඳහා භාණ්ඩාගාරය, ජාත්‍යන්තර බැංකු ඒකක මෙහෙයුම් සහ කාඩ්පත් මධ්‍යස්ථාන මෙහෙයුම් ඇතුළුව සියලුම ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍ර සඳහා අවදානම් පාලන ස්වයං තක්සේරු කිරීම් (RCSA) සිදු කළ යුතුය.</td>
</tr>
<tr>
<td>vi)</td>
<td>අවදානම් කළමනාකරණ අංශය ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර අසාර්ථක වීම් සමඟ ව්‍යාපාර බාධා කිරීම් සමඟ ඇති</td>
<td>තොරතුරු තාක්ෂණ අංශය සේවා අනුකෘතියක් සමඟ සම්මත ගිවිසුමක් සකස් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. නීතිමය නිෂ්කාශනය</td>
<td>නැවත නැවතත් සිදුවන ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර (ATM)/ CRM</td>
</tr>
</table>

	සැලකිය යුතු අවදානම් ඉස්මතු කර ඇති අතර, 2023 හතරවන කාර්තුවේදී ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර / සීආර්එම් (CRM) අසාර්ථක වීම් 179 ක් සහ 2024 හතරවන කාර්තුවේදී 249 ක් වාර්තා විය. කෙසේ වෙතත්, ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර සහාය කණ්ඩායම ඇතුළු වගකිවයුතු බලධාරීන් 2023 සහ 2024 යන වර්ෂ දෙකෙහිම පැවති මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණ කමිටු (ORMC) රැස්වීමේදී ලබාදුන් උපදෙස් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ලැබීමෙන් පසු, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර අසමත්වීම් හේතුවෙන් ව්‍යාපාර බාධා අවම කිරීම සඳහා කාලෝචිත වැළැක්වීමේ සහ නිවැරදි කිරීමේ නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා මෙම ගිවිසුම භාවිතා කරනු ඇත.	අසාර්ථකත්වයන් නිවැරදි කිරීමට සහ ORMC රැස්වීම්වලදී ගනු ලබන උපදෙස් සහ තීරණ ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට කළමනාකාරිත්වය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය.
vii)	පසුගිය වර්ෂ තුන තුළ ණය සමාලෝචන යාන්ත්‍රණ වාර්තාවලට අනුව, ණය ආරම්භ කිරීම සහ පරිපාලනය සම්බන්ධ බොහෝ සමාන විෂමතා දැනුම් දී ඇති අතර එවැනි අඩුපාඩු අභ්‍යන්තර විගණකවරුන් සහ බාහිර විගණක වාර්තා මගින් පවා වරින් වර දැනුම් දී ඇත. කෙසේ වෙතත්, ණය සම්බන්ධයෙන් සමාන අඩුපාඩු ඇතිවීමේ අවදානම අවම කිරීමේදී කළමනාකරණ ක්‍රියාමාර්ගවල අසතුටුදායක මට්ටම මෙයින් පෙන්නුම් කෙරේ.	ස්වාධීන ණය සමාලෝචන යාන්ත්‍රණ නිලධාරීන් ණය ලිපිගොනු සමාලෝචනය කර වාර්තාව ප්‍රධාන අවදානම් නිලධාරී (CRO)/මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC) වෙත ඉදිරිපත් කරයි. ඒ අනුව, එම ස්වාධීන ණය සමාලෝචන යාන්ත්‍රණ නිලධාරීන්ගේ සොයාගැනීම් මත පදනම්ව, CRO අදාළ සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) වෙත සාරාංශ වාර්තාවක් නිකුත් කරයි. සාරාංශ වාර්තාව ලැබුණු පසු, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ප්‍රාදේශීය කළමනාකරුවන් සහ ශාඛා කළමනාකරුවන් සමඟ ඔවුන්ගේ මාසික රැස්වීම්වලදී හඳුනාගත් සොයාගැනීම් ආමන්ත්‍රණය කරයි. ඊට අමතරව, ණය මෙහෙයුම්වලට අදාළ සමාන අඩුපාඩු නැවත ඇතිවීම වැළැක්වීම සඳහා ණය සමාලෝචන යාන්ත්‍රණ සොයාගැනීම් මත පදනම්ව ශාඛා කාර්ය මණ්ඩලය සඳහා අවදානම් අංශය පුහුණු සැසි පවත්වයි. 2024 වර්ෂය තුළ ශාඛා කාර්ය මණ්ඩලය සඳහා අවදානම් අංශය විසින් පුහුණු වැඩසටහන් 5 ක් පවත්වන ලදී. ණය සමාලෝචන යාන්ත්‍රණ වාර්තා, අභ්‍යන්තර විගණන සොයාගැනීම් සහ බාහිර විගණන වාර්තාවල ඉස්මතු කර ඇති ණය ප්‍රභවයන් සහ පරිපාලන ක්‍රියාවලීන්හි පුනරාවර්තන අඩුපාඩු විසඳීම සඳහා කළමනාකාරිත්වය ක්ෂණික හා තීරණාත්මක පියවර ගත යුතුය.	ණය සමාලෝචන යාන්ත්‍රණ වාර්තා, අභ්‍යන්තර විගණන සොයාගැනීම් සහ බාහිර විගණන වාර්තාවල ඉස්මතු කර ඇති ණය ප්‍රභවයන් සහ පරිපාලන ක්‍රියාවලීන්හි පුනරාවර්තන අඩුපාඩු සපුරාලීම සඳහා කළමනාකාරිත්වය ක්ෂණික හා තීරණාත්මක පියවර ගත යුතුය.
viii)	සාමාන්‍යයෙන් බැංකු අංශය තාක්ෂණය ආශ්‍රිත අවදානම් වලට බෙහෙවින් ගොදුරු විය හැකි අතර, බැංකුවේ අවදානම්	බැංකුව එම අවශ්‍යතා සපුරාලීමේ ක්‍රියාවලියක යෙදී සිටී.	තාක්ෂණය ආශ්‍රිත අවදානම් ලිහිල් කිරීම සහ ඵලදායී හඳුනා

	කළමනාකරණ අංශයේ තාක්ෂණ අවදානම් කළමනාකරණ ඒකකයට අවශ්‍ය කුසලතා සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිකම හේතුවෙන්, බැංකුවේ තාක්ෂණ අවදානම් අකාර්යක්ෂම ලෙස හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමේ ඉහළ හැකියාවක් පවතී.		ගැනීම් තක්සේරු කිරීම සහතික කිරීම සඳහා බැංකුව විසින් අවදානම් කළමනාකරණ අංශය තුළ එහි තාක්ෂණ අවදානම් කළමනාකරණ ඒකකය ශක්තිමත් කළ යුතුය.
ix)	නව මූලික බැංකු පද්ධතියක් ස්ථාපිත කිරීම ඇතුළුව බැංකුවේ පවතින මෙහෙයුම් සඳහා බොහෝ වෙනස්කම් සිදු කර ඇතත්, ප්‍රධාන මෙහෙයුම් සඳහා නව දියුණුවක් ඇතුළුව 2000 වර්ෂයේ සිට බැංකුවේ ශාඛා මෙහෙයුම් අත්පොත යාවත්කාලීන කර නොතිබුණි.	2000 ජනවාරි 01 දින දින නිකුත් කරන ලද බැංකුවේ මෙහෙයුම් අත්පොතෙහි මූලික බැංකු මූලධර්මවලට අදාළ ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි දක්වා ඇතත්, බැංකු ව්‍යාපාරය කාලයත් සමඟ පරිණාමය වී පුළුල් වී ඇති බැවින්, බැංකුව පසුව විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි චක්‍රලේඛ, උපදෙස් ලිපි සහ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අත්පොත් කිහිපයක් නිකුත් කර ඇත. ඒ අනුව, හර බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ, බැංකුව සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) හඳුන්වා දී ඇති අතර කාර්ය මණ්ඩල පරිශීලනය සඳහා ඒවා බැංකුවේ අන්තර් ජාලයෙන් ලබා ගත හැකිය. තවද, නව හර බැංකුකරණ පද්ධතියෙහි හැකියාවන් 46 ට අනුකූලව බැංකුවේ ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි නැවත සකස් කිරීම අවසන් කිරීමෙන් පසු, අතිරේක උපදෙස් ලිපි/චක්‍රලේඛ සහ ක්‍රියා පටිපාටි අත්පොත් නිකුත් කරනු ලැබේ.	බැංකුව විසින් පවතින මෙහෙයුම් සඳහා සිදු කරන ලද සියලුම වෙනස්කම් ඇතුළත් කරමින් ශාඛා මෙහෙයුම් අත්පොත් සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය.
ආ)	2024 වර්ෂයේදී පැරණි පද්ධතිවලින් නව හර බැංකු පද්ධතියට ගිණුම් ලෙජර සංක්‍රමණය කිරීමේදී, දත්ත සංක්‍රමණය, ගිණුම් සිතියම්ගත කිරීම සහ පැරණි සහ නව පද්ධති අතර අසම්පූර්ණ/වැරදි ගැලපීම් හේතුවෙන් රු. මිලියන 3,978 ක වෙනසක් ඇති බව නිරීක්ෂණය විය. පසුව, ගැලපීම් වලින් පසුව, 2025 ජූලි 31 වන විට වෙනස රු. මිලියන 1.431 දක්වා අඩු කර ඇත. කෙසේවෙතත්, පද්ධති සංක්‍රමණයෙන් වසරකට ආසන්න කාලයක් ගතවී ඇතත්, ඉතිරි වෙනස සකස් කර හෝ සම්පූර්ණයෙන්ම සමථයකට පත් කර නොතිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවලට සෘජුවම බලපාන පරිදි ගනුදෙනුකරුවන්ගේ ණය සහ තැන්පතු ශේෂයන් වැරදි ලෙස	මෙම වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන ඇති අතර, අවශ්‍ය නිවැරදි කිරීමේ ඇතුළත් කිරීම් සටහන් කර ඇත.	2024 දී පද්ධති සංක්‍රාන්තිය හේතුවෙන් පැන නගින ගිණුම් ලෙජර සංක්‍රමණ වෙනස්කම්වලට අදාළ සම්පූර්ණ සැසඳුම් සහ ගැලපුම් ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට කළමනාකාරිත්වය වහාම පියවර ගත යුතුය.

	ප්‍රකාශ කළ හැකි බැවින් එය වහාම විසඳිය යුතුය.		
ඇ)	අලෙවිකරණ අංශය සතුව දැනට විධිමත් අලෙවිකරණ ප්‍රතිපත්තියක් හෝ බැංකුවේ අලෙවිකරණ කටයුතු පාලනය කිරීම සඳහා මාර්ගෝපදේශයක්/අත්පොතක් නොතිබුණි. තවද, බැංකුව සතුව එහි වෙළඳ නාමයේ සියලුම අංශ කළමනාකරණය කිරීම සඳහා පැහැදිලි උපාය මාර්ග සහ මාර්ගෝපදේශ ගෙනහැර දක්වන වෙළඳ නාම උපාය මාර්ග ලේඛනයක් නොතිබුණි.	ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අලෙවිකරණ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ අලෙවිකරණ ප්‍රඥප්තිය මගින් පාලනය වන අලෙවිකරණ කමිටුව විසිනි. අලෙවිකරණ ප්‍රඥප්තිය යනු සෑම වසර 3 කට වරක් නිතිපතා සංශෝධනය කරනු ලබන ප්‍රතිපත්ති ලේඛනයක් වන අතර, ආයතනික කළමනාකරණ කමිටුවේ (CMC) නිර්දේශය ලැබුණු පසු, එය අවසාන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිසි ලෙස ඉදිරිපත් කරනු ලැබේ. කෙසේ වෙතත්, අභ්‍යන්තර සහ බාහිර විගණනය මෙම කාරණය සැලකිල්ලට භාජනය කර ඇති බැවින්, වෙනම අලෙවිකරණ ප්‍රතිපත්තියක් කෙටුම්පත් කර ඇති අතර දැන් එය නීති, අවදානම් සහ අනුකූලතා අවසරය ලබාගෙන ඇත. එම ප්‍රතිපත්තිය BIRMC වෙත ඉදිරිපත් කරනු ලබන අතර පසුව අවසාන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. එය 2025 දෙසැම්බර් 31 වන දිනට පෙර ක්‍රියාත්මක කිරීමට නියමිතය.	සියලුම අලෙවිකරණ සහ වෙළඳ නාමකරණ ක්‍රියාකාරකම් සඳහා පැහැදිලි මඟ පෙන්වීමක්, අනුකූලතාවයක් සහ පාලනයක් සැපයීම සඳහා බැංකුව පුළුල් අලෙවිකරණ ප්‍රතිපත්තියක් සහ වෙළඳ නාම උපාය මාර්ගයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.
ඈ)	1973 සිට 1996 දක්වා කාලය තුළ අනුරාධපුර, ඇල්පිටිය, ගල්නෑව, කතරගම, කිරිදිවැල, මොනරාගල, රත්නපුර සහ කැකිරාව ශාඛාවල පිහිටි ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා බැංකුව රුපියල් මිලියන 83.6 ක් වියදම් කර තිබුණද, මොනරාගල සහ කතරගම ශාඛා හැර එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය 2025 ජුනි 30 වන විටත් ලැබී නොතිබුණි.	අනුරාධපුර සහ කැකිරාව දිගුකාලීන කල්බදු ගිවිසුම් අවසන් කිරීම සිදුවෙමින් පවතින අතර, අනෙකුත් සියලුම කල්බදු ගිවිසුම් අවසන් කර ඇත.	ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති නමුත් තවමත් අයිතිය බැංකුවට පවරා නොමැති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය විධිමත් කිරීමට කළමනාකාරිත්වය පියවර ගත යුතුය.

ඉ)	ප්‍රාදේශීය කළමනාකරුවන්ගෙන් ලැබුණු තහවුරු කිරීම්වලට අනුව, 2025 ජුනි 30 වන විට රු. මිලියන 244.647 ක ප්‍රදානය කරන ලද ණයවලට අදාළ ණය ලිපිගොනු 297 ක් අස්ථානගත වී ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.		අස්ථානගත වී ඇති බවට වාර්තා වී ඇති සියලුම ණය ලිපිගොනු සොයා ගැනීමට, සුරක්ෂිත කිරීමට සහ නිසි ලෙස කළමනාකරණය කිරීමට කළමනාකාරිත්වය හදිසි නිවැරදි කිරීමේ සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගත යුතුය.
	i) මෙම අස්ථානගත ණය ගොනු 297 න් ණය ගොනු 110 ක් අක්‍රීය ණය කාණ්ඩ යටතේ විය. 2025 ජුනි 30 වන විට මෙම අක්‍රීය ණයවල අයවිය යුතු මුදල රු. මිලියන 53.847 කි.	i) ගැටළු මතු වූ පරිදි, ගංවතුර, වංචනික ක්‍රියාකාරකම්, මෙහෙයුම් අඩුපාඩු ඇතුළු විවිධ හේතූන් මත නිවාස ණය ලිපිගොනු සහ පුද්ගලික ණය ලිපිගොනු විනාශ වී හෝ අස්ථානගත වී ඇත. 2025 ඔක්තෝබර් 17 දිනැති වාර්තාවට අනුව, අස්ථානගත වූ මුළු ලිපිගොනු වලින් 282 ක් අස්ථානගත වූ ලිපිගොනු ලැයිස්තුවේ පවතී. කෙසේ වෙතත්, ණය ලිපිගොනු අස්ථානගත වීමට හේතු විසඳීම සඳහා ණය ලිපිගොනු වල සියයට 100 ආරක්ෂාව සහතික කිරීමට, බැංකුව පහත පියවර ක්‍රියාත්මක කර ඇත: * 2025 ජුලි 04 දිනැති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ අංක 735/2025 දරන උපදෙස් ලිපිය මගින් සෑම මාස හයකට වරක් සියලුම භෞතික ණය ලිපිගොනු සත්‍යාපනය කිරීම සඳහා ස්ථාපිත යාන්ත්‍රණය ශක්තිමත් කර ඇති අතර, එය මුලින් 2019 මාර්තු 05 දිනැති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ අංක 535/2019 දරන උපදෙස් ලිපිය මගින් හඳුන්වා දෙන ලදී. * 2025 සැප්තැම්බර් 24 දිනැති සාමාන්‍යාධිකාරීවරයාගේ අංක 1138/2025 දරන චක්‍රලේඛයට අනුව, ආරක්ෂක ලේඛන, ණය පත්‍රිකා සහ ලිපි හුවමාරු ලේඛන වෙන වෙනම පවත්වාගෙන යාම සඳහා බැංකුව ඒකාකාර ක්‍රියා පටිපාටියක් හඳුන්වා දී ඇත. මෙම ක්‍රියාවලිය මඟින් ණය ලිපිගොනු වරින් වර සත්‍යාපනය කිරීමත් සමඟ ද්විත්ව පාලනය යටතේ සියලුම ආරක්ෂක ලේඛන සුරක්ෂිතව තබා ගැනීම සහතික කෙරේ. * තවද, එම කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද පෙර උපදෙස් නැවත මතක් කිරීමක් ලෙස, 2025 ජුලි 03 දිනැති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී උපදෙස් ලිපිය අංක 734/2025 නිකුත් කිරීමෙන්, ණය ලිපිගොනු සුරක්ෂිතව තබා ගැනීම සම්බන්ධයෙන් ස්ථාපිත මූල ලේඛනවලට අනුකූල වීමේ අවශ්‍යතාවය බැංකුව	

	නැවත අවධාරණය කර ඇත.
ii) අස්ථානගත වූ මුළු ණය ගොනු 297 න් 01 ක් ස්ථාවර තැන්පතු මත ලබා දුන් ණයවලට අදාළ විය. iii) අස්ථානගත වූ මුළු ණය ගොනු 297 න්, රු. මිලියන 1.462 ක සමස්ත අයවිය යුතු ශේෂයක් සහිත ණය ගොනු හයක් නීතිමය කටයුතු යටතේ පැවතුනි. මෙම ලිපිගොනු අස්ථානගත වීම හේතුවෙන්, ණය ගැණුම්කරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බැංකුවට නොහැකි වූ අතර, ණය අයකර ගැනීමෙන් පසු ගනුදෙනුකරුවන්ගේ ඔප්පුව නිදහස් කළ නොහැක. මෙය දිගු කාලීනව බැංකුවේ යහපත් ප්‍රතිරූපයට හානි කළ හැකිය.	ii) සහ iii) මෙම ණය සඳහා ණය අයදුම්පත් විස්තර, මුදාහැරීමේ තොරතුරු සහ ආපසු ගෙවීමේ වාර්තා පරිගණක පද්ධතියෙන් ලබා ගත හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස, ණය ගැතියන්ගේ හිඟ වගකීම් ඔප්පු කිරීමට ප්‍රමාණවත් තොරතුරු බැංකුව සතුව ඇති අතර, අවශ්‍ය නම් ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට පදනමක් සපයයි. තවද, පරිගණක පද්ධතිය ණය ගෙවීම්, පසුගිය ආපසු ගෙවීම් සහ අනාගත ආපසු ගෙවීමේ කාලසටහන් සම්බන්ධ වාර්තා ග්‍රහණය කර ගබඩා කරන අතර, එමඟින් බැංකුවට ණය සම්පූර්ණයෙන් පියවීම සහතික කිරීමට ඉඩ සලසයි. සම්පූර්ණ පියවීමෙන් පසු, බැංකුව විසින් ස්ථාපිත ඔප්පු නිදහස් කිරීමේ ක්‍රියාපරිපාටි අනුගමනය කරමින් අදාළ ගනුදෙනුකරුවන්ට ඔප්පු නිකුත් කරනු ඇත. කෙසේ වෙතත්, මුල් ඔප්පුව විනාශ වී ඇති හෝ අස්ථානගත වී ඇති අවස්ථාවන්හිදී, අනුපිටපත් ඔප්පුවක් නිකුත් කිරීම නොවැළැක්විය හැකි වනු ඇති අතර, ගනුදෙනුකරුගේ කැමැත්ත සහ එකඟතාවය ලබා ගැනීමෙන් පසු, ඉඩම් ලේඛනාගාරය සහ මූල් නීතිඥවරයා වෙත යොමු කෙරේ.
iv) අස්ථානගත වූ මුළු ණය ලිපිගොනු 297 න් කඩුවෙල ශාඛාවේ ණය ලිපිගොනු 190 ක් ගංවතුර තත්ත්වය හේතුවෙන් අස්ථානගත විය. ඉන් ණය ගොනු 41ක් අක්‍රිය කාණ්ඩයට අයත් විය. 2025 ජුනි 30 වන විට මෙම ණයවල මුළු අයවිය යුතු ශේෂය රු. මිලියන 18.622 ක් විය.	iv) කඩුවෙල ශාඛාවේ ලිපිගොනු විනාශ වීමට හෝ අස්ථානගත වීමට ප්‍රධාන හේතුව 2016 දී ඇති වූ දරුණු ගංවතුර සිදුවීමයි. එය බැංකුව මෙතෙක් අත්විඳ ඇති දරුණුතම ගංවතුර සිදුවීම්වලින් එකකි. මෙම ණය අක්‍රිය වීමට හේතු වූ මූලික හේතු ආමන්ත්‍රණය කරමින් ඒවා අයකර ගැනීමට බැංකුව සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. අවශ්‍ය නම්, පරිගණක පද්ධතියේ ඇති තොරතුරු සහ ව්‍යසනයෙන් විනාශ නොවූ ඉතිරි ලේඛන භාවිතා කරමින් ණය අයකර ගැනීමට බැංකුව නීතිමය ක්‍රියාමාර්ග ගනු ඇත.
v) ප්‍රධාන කාර්යාල ශාඛාවේ අස්ථානගත වූ ණය ලිපිගොනු 21 ක් වූ අතර එම ණය ලිපිගොනු 20 න් අක්‍රිය පුද්ගලික ණය කාණ්ඩයට අයත් වූ අතර ඉන් ලිපිගොනු 16 ක් එම ශාඛාවේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් සිදු කරන ලද වංචාවන්ට සම්බන්ධ විය.	v) ප්‍රධාන කාර්යාල ශාඛාවේ පුද්ගලික ණය ලිපිගොනු 16 ක් සම්බන්ධයෙන් වංචාවක් සිදු කළ කාර්ය මණ්ඩල සාමාජිකයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙමින් පවතී. කෙසේ වෙතත්, එම වංචනික ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වූ අලාභයෙන් 85% ක් දැනටමත් රක්ෂණ හිමිකම් පෑමක් හරහා අයකර ගෙන ඇත. නැතිවූ බවට වාර්තා වී ඇති ඉතිරි ලිපිගොනු පහෙන් එකක් ක්‍රියාකාරී කාණ්ඩයට අයත් වන අතර අනෙක් ලිපිගොනු හතර අක්‍රීය

ලෙස වර්ගීකරණය කර ඇත. කෙසේ වෙතත්, අස්ථානගත වූ කාණ්ඩයේ අක්‍රීය ණයවල හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා නිතිපතා අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සිදු කරනු ලැබේ.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

3.3.1 ණය ලබාදීම සහ පරිපාලනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	2020 දෙසැම්බර් 23 වන දින කටුගස්තොට ප්‍රදේශයේ පිහිටි ඉඩමක උකසක් මගින් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන 164.73 ක බද්ධ දේපළ ණයක් පුද්ගලයින් දෙදෙනෙකුට බැංකුව විසින් ප්‍රදානය කර තිබුණි. 2021 සිට ණය මුදල පැහැර හැර ඇති බැවින්, උකස් කරන ලද දේපළ සම්බන්ධයෙන් වෙන්දේසියක් පැවැත්වීමට බැංකුව තීරණය කර ඇත.		
	(i) අධ්‍යක්ෂ මණ්ඩලය, අංක 243/2023 දරන මණ්ඩල පත්‍රිකාව හරහා, වෙන්දේසි ක්‍රියාවලිය හැසිරවීමට සහකාර සාමාන්‍යාධිකාරී - අයකිරීම් පත් කර තිබුණි. කෙසේ වෙතත්, සහකාර සාමාන්‍යාධිකාරී - අයකිරීම් 2024 පෙබරවාරි 05 දිනැති ලිපියක් හරහා මෙම වගකීම ප්‍රධාන කළමනාකරු - අයකිරීම් වෙත පවරන ලද අතර එමඟින් මණ්ඩලයේ තීරණය අභිබවා ගොස් තිබුණි.	(i) 2023 ජුලි 24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවලට අනුකූලව, මෙම ණයට ඇප ලෙස උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණීමට මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. මෙම කාර්යය ඉටු කිරීම සඳහා සහකාර සාමාන්‍යාධිකාරී - අයකිරීම් වෙත පවරා ඇති අතර, ඔහු විසින් වෙන්දේසියේදී බැංකුව නියෝජනය කිරීමට සහ අවශ්‍ය සියලු කටයුතු විධිමත්ව ඉටු කිරීමට වගකීම් ප්‍රධාන කළමනාකරු - අයකිරීම් වෙත පවරා ඇත. මෙය මෙතෙක් බැංකුවේ සම්ප්‍රදායික පිළිවෙතක් වී ඇත.	අධ්‍යක්ෂ මණ්ඩල තීරණ දැඩි ලෙස පිළිපැදීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නියෝගවලින් අනවසර පැවරීමක් හෝ බැහැරවීම වැළැක්වීම බැංකුව විසින් සහතික කළ යුතුය.
	(ii) 2025 ජුලි 21 වන විට, ණයෙහි මුළු අයවිය යුතු ශේෂය රුපියල් මිලියන 220.755 ක් විය. 2024 ජුලි 04 දිනැති තක්සේරු වාර්තාවට අනුව, උකස් කරන ලද ඉඩමේ වෙළඳපොල වටිනාකම රුපියල් මිලියන 197.4 ක් ලෙස තක්සේරු කරන ලදී. 2024 වර්ෂය තුළ බැංකුව දේපළ විකිණීමට දෙවරක් උත්සාහ කර ඇත. කෙසේ වෙතත්, අපේක්ෂිත ගැනුම්කරුවෙකු හඳුනාගෙන	(ii)වෙන්දේසියට පෙර දේපළෙහි වෙළඳපොල වටිනාකම සැලකිල්ලට ගනිමින් අඩුම මිල තීරණය කරන ලදී. 2024 ජනවාරි 22 දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය, වෙන්දේසියකින් දේපළ විකිණීම	හිඟ ණය ශේෂය අයකර ගැනීමට සහ තවදුරටත් මූල්‍ය අලාභය අවම කිරීමට බැංකුව සුදුසු සහ ක්‍රියාකාරී පියවර ගත යුතුය.

නොතිබුණි.

සඳහා අඩුම මිල රු. මිලියන 198 ක් ලෙස නියම කිරීමට අනුමැතිය ලබා දී තිබුණ නමුත් මුළු පියවීමේ මුදල අඩුම මිලට වඩා වැඩිය. බැංකුව විසින් 2024 පෙබරවාරි 06 දින දේපළ සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වන ලදී. කෙසේ වෙතත්, අපේක්ෂිත ගැනුම්කරුවන් කිසිවෙකු පැමිණ නොසිටි බැවින්, දේපළ බැංකුවට පවරා ගන්නා ලදී. බැංකුව විසින් දේපළ නැවත විකිණීම සඳහා ටෙන්ඩරයක් ආරම්භ කරන ලද අතර, 2024 අගෝස්තු 02 දින ටෙන්ඩර් දැන්වීම් ප්‍රකාශයට පත් කරන ලද අතර, ටෙන්ඩර් පිළිගැනීම 2024 අගෝස්තු 23 දින පස්වරු 2.30 ට අවසන් කරන ලදී. එක් ලංසුවක් පමණක් ලැබුණි. කෙසේ වෙතත්, ලංසුකරු එයට සැලකිල්ලක් දක්වා නැත. එබැවින්, දේපළ තවමත් බැංකුව නමින් පවතී. මේ අතර, එම ණයගැතියන් එම දේපළවලට අදාළ වෙන්දේසිය පැවැත්වීම අභියෝගයට ලක් කරමින් නඩු දෙකක් ගොනු කර ඇත. මෙම නඩුවේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙනුවෙන් ගරු නීතිපතිවරයා පෙනී සිටී.

ආ) බැංකු දෙකක් - ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ මහජන බැංකුව විසින් 2018 ජුනි 14 වන දින මාලදිවයින් සමාගමකට එක්සත් ජනපද ඩොලර් මිලියන 10 ක සමෝදානික ණය (Syndicated loan) පහසුකමක් ලබා දී තිබුණි. මුළු ණය මුදලින් සියයට 90 ක් නියෝජනය කරමින් බැංකුව එක්සත් ජනපද ඩොලර් මිලියන 9 ක දායකත්වයක් ලබා දී තිබුණි. ණය ගැතියා කිසිදු ප්‍රාග්ධන ආපසු ගෙවීමක් සිදු කිරීමට අපොහොසත් වී ඇති අතර, 2025 මැයි 31 වන විට එක්සත් ජනපද ඩොලර් මිලියන 5.35 ක හිඟ පොලියක් නොගෙවා පැවතුනි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

i) පසු ණය සමාලෝචන යාන්ත්‍රණය පිළිබඳ චක්‍රලේඛ අංක 1641/2015 ට පටහැනිව, අනුමැතිය ලබා දී මාස තුනක් ඇතුළත ණය පහසුකම පිළිබඳ සමාලෝචනයක්

ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM) සඳහා සවිස්තරාත්මක තොරතුරු LRM

පශ්චාත් මුදාහැරීම් අධීක්ෂණය (Post disbursement

පැවැත්වීමට බැංකුව අපොහොසත් වී තිබුණි.	සිදු කිරීම සඳහා නියමිත කාල සීමාව තුළ ලබා ගත නොහැකි විය. කෙසේ වෙතත්, මෙම පහසුකම පිළිබඳව අවදානම් කළමනාකරණ අංශය විසින් පශ්චාත් මුදාහැරීම් (post disbursement) අවදානම් තක්සේරු කිරීම් කිහිපයක් සිදු කර ඇත.	monitoring) සහ ණය අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා පශ්චාත් ණය සමාලෝචන යාන්ත්‍රණය පිළිබඳ චක්‍රලේඛ අංක 1641/2015 සමඟ දැඩි ලෙස අනුකූල වීම බැංකුව සහතික කළ යුතුය.
ii) 2018 ජුනි 21 වන පළමු ණය මුදාහැරීමේ දින සිට ආරම්භ වන පරිදි ප්‍රාග්ධන ආපසු ගෙවීම සඳහා බැංකුව මුලින් වසරක සහන කාලයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, විවිධ හේතූන් මත 2018 ජුනි සිට 2022 ජුනි දක්වා කාලය ආවරණය වන පරිදි ප්‍රාග්ධන සහ පොලී ආපසු ගෙවීම් සඳහා මෙම සහන කාලය පසුව කිහිප වතාවක් දීර්ඝ කර තිබුණි.	ගෝලීය වශයෙන් මුහුණ දී ඇති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සේවාදායකයා මුහුණ දෙන ව්‍යාපාරික බාධාවන් සඳහන් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහන කාලය දීර්ඝ කිරීම් ලබා දෙන ලදී. අදාළ මණ්ඩල පත්‍රිකා අංක සහ පමා සහන සඳහා අනුමත දිනයන් පහත දැක්වේ. මණ්ඩල පත්‍රිකා අංකය — අනුමත දිනය 142/2022 — 12.05.2022 381/2021 — 23.11.2021 277/2021 — 09/09/2021 093/2021 — 30.03.2021 406/2020 — 08.10.2020 276/2020 — 09.07.2020 229/2020 — 29.06.2020 10/303/2019 — 29.07.2019	ණය ආපසු ගෙවීම් සඳහා සහන කාල සීමාවන් දීර්ඝ කිරීම, සාධාරණීකරණය කළ, විනිවිද පෙනෙන සහ ප්‍රතිපත්තිවලට අනුකූල තත්වයන් යටතේ පමණක් ලබා දෙන බවට බැංකුව සහතික විය යුතුය.
iii) 2021 ජුලි මාසයෙන් පසු රක්ෂණ ආවරණය බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි.	බැංකුව බොහෝ අවස්ථාවලදී රක්ෂණ ආවරණය අලුත් කරන ලෙස ඉල්ලා ඇතත් තවමත් ලැබී නොමැත. ඉල්ලීම විද්‍යුත් තැපෑලෙන් පහත දිනවලදී යවා ඇත. 17.01.2023 11.11.2022 21.09.2022 23.07.2020	පහසුකම සම්බන්ධයෙන් වලංගු රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට බැංකුව වහාම පියවර ගත යුතුය.
iv) ණය ගිවිසුමට අනුව, අවම වශයෙන් ඇමරිකානු ඩොලර් 270,000 ක ශේෂයක් සහිතව ණය සේවා සංචිත ගිණුමක් (DSRA) විවෘත කර පවත්වාගෙන යා යුතුය.	DSRA ගිණුම් ශේෂය ඉහළ නංවන ලෙස බැංකුව සේවාදායකයාගෙන් ඉල්ලා	ණය සේවා සංචිත ගිණුම (DSRA) පවත්වාගෙන යාමට අදාළ ණය ගිවිසුම්

කෙසේ වෙතත්, ණය ගැණුම්කරු අවශ්‍ය අවම ශේෂය පවත්වා ගැනීමට අපොහොසත් වූ අතර, 2025 මැයි 31 වන විට, DSRA සතුව ඇමරිකානු ඩොලර් 27,917.26 ක ශේෂයක් පමණක් පැවතුණි.	සිටියද එය තවමත් සිදුවී නොමැත. DSRA ශේෂය අඩුවීමට හේතුව බැංකුව මුලදී ගිණුමෙන් කල්පසුවූ වූ පොලිය සහ බැඳීම් සඳහා ගාස්තුව අයකර ගැනීමයි. 21.05.2019– එ.ජ.ඩො. 72,647.42 21.05.2019– එ.ජ.ඩො. 78,974.62 22.05.2019– එ.ජ.ඩො. 76,558.68 21.07.2022– එ.ජ.ඩො. 13,902.02	දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම බැංකුව විසින් සහතික කළ යුතු අතර, එහි ආපසු ගෙවීම් සහතික කිරීමේ යාන්ත්‍රණයන් ආරක්ෂා කර ගත යුතුය.
v) 2018 ජූනි 1 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) සහ ආයතනික මූල්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු විසින් ස්ථාන පරීක්ෂණ සිදු කරන ලද අතර, පසුව 2018 නොවැම්බර් 13 වන දින එම අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් දෙදෙනෙකු විසින් සිදු කරන ලදී. විවිධ අංශ හරහා සියයට 50 සිට 100 දක්වා ප්‍රගති මට්ටමක් පරීක්ෂණවලින් පෙන්නුම් කෙරිණි. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය නිවැරදිව තක්සේරු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන, අවශ්‍ය තාක්ෂණික විශේෂඥතාව ඇති බැංකු ඉංජිනේරුවෙකු පරීක්ෂණ කණ්ඩායමට ඇතුළත් කර නොතිබුණි.	කර්මාන්ත පිළිවෙතට අනුව, ව්‍යාපෘතිය හසුරුවන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- ණය සහ ජ්‍යෙෂ්ඨ ණය නිලධාරීන් ස්ථානීය පරීක්ෂාව සඳහා ස්ථානයට පැමිණියහ. 2018 ජූනි 01 සහ 2018 නොවැම්බර් 13 දිනැති පරීක්ෂණ වාර්තා ලබා ගත හැකිය.	පරීක්ෂණ කණ්ඩායම, ප්‍රගති මට්ටම නිවැරදිව ලබා ගැනීමට අවශ්‍ය තාක්ෂණික කුසලතා සහ නිපුණතා ඇති සාමාජිකයෙකුගෙන් සමන්විත විය යුතුය.
vi) පසුව, 2022 ඔක්තෝබර් 12 වන දින, බැංකුව විසින් පහසුකම පිළිබඳ ඉහළ මට්ටමේ සමාලෝචනයක් පැවැත්වීමට සහ ණය ගැණුම්කරුගෙන් සියලුම හිඟ මුදල් අයකර ගැනීම සඳහා වඩාත්ම විචක්ෂණශීලී, ලාභදායී සහ කාර්යක්ෂම ක්‍රියාමාර්ග පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීමට ශ්‍රී ලංකාවේ ගෝලීය ගිණුම්කරණ සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. • ඉහත සඳහන් ගිණුම්කරණ සමාගම විසින් සකස් කරන ලද මූල්‍ය හා බදු වාර්තාවෙන් ලබාගත් තොරතුරුවලට අනුව, ස්වාධීන තක්සේරුකරුවෙකු විසින් 2023 ජනවාරි 2 සහ 3 යන දිනවල ස්ථානීය පරීක්ෂණයක් සිදු කර තිබුණි. ස්වාධීන තක්සේරුකරු විසින් වාර්තා කරන ලද ප්‍රගතිය සහ සමාගමේ වරලත් ප්‍රමාණ සමීක්ෂක විසින් 2018 දෙසැම්බර් 31 වන දිනට වාර්තා කරන ලද සමස්ත ඉදිකිරීම් ප්‍රගතිය අතර සැලකිය යුතු විෂමතා හඳුනාගෙන තිබුණි. විස්තර පහත පරිදි වේ:	ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාව සඳහා සහ එයට අදාල කටයුතු ඉදිරියට ගෙන යාමට සමාගම බැංකු දෙකෙන්ම අනුමැතිය ඉල්ලා සිටින ලදී. සුදුසු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මණ්ඩලය භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් උපදෙස් ඉල්ලා ඇත.	බැංකුව පහත සඳහන් දේ සහතික කරමින් එහි ව්‍යාපෘති අධීක්ෂණ රාමුව ශක්තිමත් කළ යුතුය: i) ස්වාධීන ප්‍රගති සත්‍යාපන නියමිත කාල පරතරයන්හිදී පැවැත්විය යුතුය. ii) ඕනෑම ව්‍යාපෘති වෙනස් කිරීමක් විධිමත් ලිපි හුවමාරුවකින් සහ පූර්ව අනුමැතියකින් තහවුරු කළ යුතුය. iii) ගෙවීම්, සත්‍යාපිත ප්‍රගතිය සහ ගිවිසුම් නියමයන්ට අනුකූල

කාමර වර්ගය	**සම්පූර්ණ කරන ලද ප්‍රතිශතය**	
	2023 ජනවාරි 2 සහ 3 යන දිනවල සිදු කරන ලද ස්වාධීන පරීක්ෂණයට අනුව	සමාගමේ වරලත් මිනින්දෝරුවරයාගේ BOQs අනුව (2018 දෙසැම්බර් 31)
ගාඩ්න් විලාස්	90 %	99 %
සෙමි වෝටර් විලාස්	30%	78%
බීච් විලාස්	10%	78%
වෝටර් විලාස්	0%	72%
ෆ්‍රන්ට් ඔෆ් හවුස්	0% - 60%	23% - 93%
බැක් ඔෆ් හවුස්	0% - 90%	79% - 100%

තවද, වාර්තාවේ සඳහන් වූයේ සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 34 ක මූලික අයවැයක් භාවිතා කර ඇතත්, ව්‍යාපෘතිය දැනට අසම්පූර්ණ තත්ත්වයක පවතින බවත්, සංවර්ධනයේ සමස්ත නිම කිරීමේ මට්ටම සියයට 46 ක් පමණ වන බවත්ය.

තවද, ව්‍යාපෘති යෝජනාවේ සහ BOQ හි සඳහන් නිවාස (villas) ගණනට අදාළ වෙනසක් නිරීක්ෂණය විය. ස්වාධීන සමාගමේ වාර්තාවේ සඳහන් වූයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ සමාගම අතර අත්සන් කරන ලද ගිවිසුම මත පදනම්ව, මුල් සැලැස්මට සිදු කරනු ලබන ඕනෑම වෙනස් කිරීමක් නිසි ලෙස දැනුම් දිය යුතු බවයි. කෙසේ වෙතත්, එවැනි වෙනස්කම් සම්බන්ධයෙන් සමාගම සන්නිවේදනය කළ බව තහවුරු කිරීම සඳහා කිසිදු ලිපි හුවමාරුවක් ලබා දී නොමැති අතර, එබැවින්, ඔවුන් එය ගිවිසුම උල්ලංඝනය කිරීමක් ලෙස වාර්තා කර තිබුණි. මූලික ව්‍යාපෘති යෝජනාවේ සහ BOQ හි සඳහන් සැලසුම් කළ නිවාස ගණන සංසන්දනය කිරීම. විස්තරය පහත පරිදි වේ.

වීම සමඟ දැඩි ලෙස සම්බන්ධ වී ඇති බව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් පාලනයන් ක්‍රියාත්මක විය යුතුය.

කාමර වර්ගය	**ව්‍යාපෘති යෝජනාවට අනුව විලා ගණන (2017 දෙසැම්බර්)**	**වරලත් සමීක්ෂක විසින් සපයන ලද BOQ අනුව විලා ගණන (2018 දෙසැම්බර්)**
ගාඩ්න් විලාස්	102	111
සෙමි වෝටර් විලාස්	20	20
බීච් විලාස්	2	20
වෝටර් විලාස්	50	70
එකතුව	174	221

ඇ)	2019 සැප්තැම්බර් 23 වන දින, නිවසක් සහ දේපළක් මිලදී ගැනීම සඳහා බැංකුව විසින් එක්තරා ණය ගැණුම්කරුවෙකුට රුපියල් මිලියන 12.6 ක ණයක් ලබා දී තිබුණි. 2025 මැයි 31 වන විට, අයවිය යුතු ණය ශේෂය රුපියල් මිලියන 22.081 ක් වූ අතර, මුළු හිඟ මුදල රුපියල් මිලියන 8.890 (මාස 67) කි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ. i) ණය ගැනුම්කරුගේ CRIB තත්ත්ව වාර්තාවෙන් පිළිබිඹු වන ණය පහසුකම් 10 ක අක්‍රමවත් ආපසු ගෙවීමේ ඉතිහාසය සැලකිල්ලට නොගෙන සහකාර සාමාන්‍යාධිකාරී (ණය) මෙම ණය මුදල අනුමත කර තිබුණි.	මෙය ගනුදෙනුකරුවන්ගේ ඇගයීමේදී නිරීක්ෂණය කරන ලද අතර, CRIB ඉතිහාසය අක්‍රමවත් බැවින් ණය ආපසු ගෙවීම් සමීපව නිරීක්ෂණය කරන ලෙස උපදෙස් දෙමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) විසින් CRIB වාර්තාවේ සටහනක් තබා ඇත.	ණයක් ලබා දීමට පෙර බැංකුව නිසි ගනුදෙනුකරු ඇගයීමක් ක්‍රියාත්මක කළ යුතු අතර බැංකුව විසින් පනවන ලද පැවරුම් බලතල සීමාවන්ට අනුකූල වීම සහතික කළ යුතුය.
	ii) ණයක් ලබා දීමේදී, ආපසු ගෙවීමේ හැකියාව සහතික කිරීම සඳහා බැංකුව ණය ගැණුම්කරුගේ මූල්‍ය හැකියාව තක්සේරු කිරීමට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ණය ගැණුම්කරුගේ තනි මූල්‍ය ධාරිතාව තක්සේරු කිරීම වෙනුවට, ණය ගැණුම්කරු සියයට 40 ක හිමිකාරීත්ව කොටස් හිමිකරගෙන සිටින සමාගමේ මූල්‍ය තත්ත්වය බැංකුව තක්සේරු කර ඇත. ණය ගොනුවට අනුව, බැංකුව ණය ගැණුම්කරුගේ පුද්ගලික බැංකු ප්‍රකාශන ලබාගෙන නොමැති බව හෝ ඔහුගේ මාසික ආදායම සත්‍යාපනය කර නොමැති බව නිරීක්ෂණය විය.	ii) සමාගමේ සාමාන්‍ය ලාභයෙන් සියයට 40 ක් ණය ගැණුම්කරුගේ ආදායමක් ලෙස සලකනු ලබන්නේ ඔහු සමාගමේ සියයට 40 ක හිමිකාරීත්වයක් දරන බැවිනි. මූල්‍ය හැකියාව තක්සේරු කිරීම සඳහා සමාගමේ බැංකු ප්‍රකාශන සහ විගණනය කරන ලද සමාගම් මූල්‍ය ප්‍රකාශන සහ ණය ගැණුම්කරුගේ ආදායම්	බැංකුවේ ණය ප්‍රතිපත්තියට අනුව ණයක් ලබා දීමට පෙර බැංකුව ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ තත්ත්වය තක්සේරු කළ යුතුය.

			ගණනය කිරීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) වෙතින් පූර්ව අනුමැතිය ලබා ගන්නා ලදී.	
	iii)2025 මැයි 31 වන විට, ණය ගැණුම්කරු ගෙවා තිබුණේ එක් (01) වාරිකයක් පමණි. උකස් කරන ලද දේපල වෙන්දේසිය සම්බන්ධයෙන් අවසන් දැන්වීමක් 2022 ජූලි 19 වන දින සහකාර සාමාන්‍යාධිකාරී (අයකරගැනීම්) විසින් ණය ගැණුම්කරුට නිකුත් කරන ලදී. බැංකුව විසින් පරාටේ (parate) අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ විට, ණය ගැණුම්කරු 2023 ජනවාරි 19 වන දින වෙන්දේසි ක්‍රියාවලිය නැවැත්වීම සඳහා අතුරු තහනම් නියෝගයක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, 2024 ජනවාරි 9 දිනැති නියෝගයක් මගින්, අධිකරණය බැංකුවට එරෙහිව ලබා දී තිබූ අතුරු තහනම් නියෝගය ඉවත් කර තිබුණි. පසුව, ණය ගැණුම්කරු දිස්ත්‍රික් අධිකරණ නඩුවට අදාළව බැංකුව සමඟ බේරුම්කරණ සාකච්ඡාවලට එළඹුණි. බේරුම්කරණ කොන්දේසි ගොනු කිරීම සඳහා නඩුව 2025 මැයි 19 වන දින විභාගයට ගන්නා ලදී. කෙසේ වෙතත්, ණය ගැණුම්කරු බැංකුවට එකඟ වූ ගෙවීම් සිදු කිරීමට අපොහොසත් වී තිබුණි.		වෙන්දේසිය 2023 ජනවාරි 19 දිනට නියමිතව තිබූ අතර, ගණුදෙනුකරු විසින් අත්හිටුවීමේ නියෝගයක් ලබාගෙන ඇත. 2023 ජුනි 21 දින විරෝධතා ගොනු කරන ලදී. උසාවියේ නඩුව දිගටම පැවති අතර, අවසාන බේරුම්කරණය සඳහා ඊළඟ නඩු දිනය 2025 නොවැම්බර් 13 දිනට නියමිතය. ඇටෝර්නි බලපත්‍රලාභියා 2025 ජූලි 30 දින රු. මිලියන 1.0 ක් සහ 2025 අගෝස්තු 01 දින තවත් රු. මිලියන 1.0 ක් ගෙවා ඇත.	මෙම ණය මුදල අයකර ගැනීම සඳහා බැංකුව විසින් ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගත යුතුය.

ඇ) 2025 මැයි 31 වන විට, විශාලතම අක්‍රිය ගනුදෙනුකරුවන් 25 දෙනා සඳහා ලබා දී ඇති මුළු ණය මුදල රුපියල් මිලියන 517.95 ක් විය. මෙම ණය සඳහා මුළු අයවිය යුතු ශේෂය සහ මුළු හිඟ මුදල් පිළිවෙලින් රුපියල් මිලියන 531.60 ක් සහ රුපියල් මිලියන 124.10 ක් විය. මෙම ණය 25 අතරින් ණය 15 ක් 'අලාභ' කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇති අතර, එහි ඒකාබද්ධ අයවිය යුතු ශේෂය රුපියල් මිලියන 335.86 කි. මෙම ඉහළම අක්‍රීය ණය සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණය මත පදනම්ව පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

i)	3000239 76777- රු, මිලියන 20	අ) 2025 මැයි 31 වන විට මුළු හිඟ මුදල් රු. මිලියන 9.87 ක් වූ අතර මාස 35 ක හිඟ මුදලක් ගෙවීමට තිබුණි. ආ) ණය කමිටුව විසින් පළමු වසර 2 සඳහා සියයට 8.5 ක ස්ථාවර අනුපාතයකට සහ ඉන් පසුව පාවෙන (floating) අනුපාතයකට රුපියල් මිලියන 20 ක ණය මුදලක් ලබා දීමට	2024/03/27 දින පරාටේ ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. 2025/12/31 දින දක්වා රජයේ "පරාටේ ක්‍රියාමාර්ගය" අත්හිටුවීම හේතුවෙන් වෙන්දේසි ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවා ඇත. බැංකුව පරාටේ ක්‍රියාමාර්ගය දිගටම කරගෙන යනු ඇත. පාරිභෝගිකයා	ණය ගිවිසුමේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි දැඩි ලෙස පිළිපැදීම බැංකුව සහතික කළ යුතු අතර, සිදුවිය හැකි මූල්‍ය පාඩු වලින් බැංකුව ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය සියලු පියවර ගත යුතුය.

		අනුමැතිය ලබා දී තිබුණි. 2021 ජුනි 16 වන දින ලබා දුන් දින සිට 2023 ජුනි 15 වන දිනට වසර 02 ක් ඉකුත් වී ඇතත්, ණය පොලී අනුපාතය සියයට 15 ක වත්මන් පාවෙන අනුපාතයට පරිවර්තනය කර නොතිබුණි.	2025/07/31 දින රු.100,000/- ක් සහ 2025/09/16 දින රු.25,000/- ක් ගෙවා ඇත.	
ii)	3000239 51936– රු.මිලියන 16.94	අ) 2025 මැයි 31 වන විට මාස 35 ක හිඟ මුදලක් සමග මුළු නොගෙවූ මුදල සහ මුළු අයවිය යුතු මුදල පිළිවෙලින් රු. මිලියන 5.131 ක් සහ රු. මිලියන 20.92 කි. ආ) 2020 ජූලි 02 දිනැති ණය ගිවිසුමට අනුව, පළමු මාස 24 සඳහා සියයට 12.5 ක ස්ථාවර පොලී අනුපාතයකට ණය ලබා දීමට නියමිතව තිබූ අතර, ඉන් පසුව පාවෙන අනුපාතයක් අනුගමනය කර තිබුණි. කෙසේ වෙතත්, ණය පද්ධතියේ ණය තත්ත්ව වාර්තාවෙන් පෙන්නුම් කරන්නේ බැංකුව සියයට 8.5 ක පොලී අනුපාතයක් භාවිතාකර තිබූ බවයි. මෙම පොලී අනුපාතය අඩු කිරීම සඳහා කිසිදු අනුමැතියක් ලබා දී ඇති බවට කිසිදු සාක්ෂියක් විගණනයේදී හමු නොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස, මුල් මාස 24 කාලය තුළ බැංකුවට රු. 1,090,848 ක පොලී අලාභයක් සිදුවිය.	2024/03/27 දින පරාටේ ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. 2025/12/31 දක්වා " රජයේ "පරාටේ ක්‍රියාමාර්ගය අත්හිටුවීම හේතුවෙන් වෙන්දේසි ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවා ඇත. බැංකුව පරාටේ ක්‍රියාමාර්ගය දිගටම කරගෙන යනු ඇත.	ණය ගිවිසුමේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි දැඩි ලෙස පිළිපැදීම බැංකුව සහතික කළ යුතු අතර, සිදුවිය හැකි මූල්‍ය පාඩු වලින් බැංකුව ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය සියලු පියවර ගත යුතුය.
iii)	3000239 94104– රු. මිලියන 26.6	අ) 2025 මැයි 31 වන විට මාස 33 ක හිඟ මුදලක් සහිතව මුළු නොගෙවූ මුදල වන රු. මිලියන 12.984 ක් ණය මුදලෙහි මුළු අයවිය යුතු මුදල වූ රු. මිලියන 34.13 න් සියයට 38 ක් විය. ආ) මෙම ණය මුදලේ ගැණුම්කරු පුද්ගලික සීමිත සමාගමක අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් එක් අයෙකු වන අතර එම ණය	පරාටේ ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට පෙර, 2025 ජූලි 18 දින ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. ගොනුව 2025 ජූලි 25 දින විගණන අංශයට යවන ලදී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) විසින් විමර්ශනයක් පවත්වා ඇති අතර, ණය ලබා ගැනීම සඳහා වංචනික ලියකියවිලි ඉදිරිපත් කිරීම	ණය ලබා දීමට පෙර බැංකුව ව්‍යාපාරයේ ආදායම/ලාභය නිසි ලෙස තක්සේරු කළ යුතු අතර, සිදුවිය හැකි මූල්‍ය පාඩු වලින් බැංකුව ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය සියලු පියවර ගත යුතුය.

ගැණුම්කරුගේ ආදායම් ඇගයීම සමාගමේ ව්‍යාපාරික ලාභය මත පදනම්ව බැංකුව විසින් සිදු කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, වර්ෂය සඳහා වූ ලාභය රඳවා ගත් ඉපැයීම් යටතේ ප්‍රාග්ධනිත කර තිබූ අතර එමඟින්; ණයක් ලබා දීම සඳහා බැංකුව විසින් මුළු ව්‍යාපාර ලාභයම එම අධ්‍යක්ෂවරයාගේ ආදායම ලෙස ගෙන ඇති ආකාරය විගණනයට මතභේදාත්මක වේ.	හේතුවෙන් අධිකරණ නඩුවක් ආරම්භ කර ඇත.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	2008 මැයි 08 වන දින බැංකුව විසින් පර්චස් 38.8 ක ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරියෙන් වසර 50 ක බදු පදනම මත ලබාගෙන ඇත. මෙම ඉඩමේ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කළමනාකාරීත්වය තීරණය කර තිබුණද, මෙතෙක් කිසිදු ඉදිකිරීමක් ආරම්භ කර නොතිබුණි.	2008 වසරේදී මෙම ඉඩම වසර 50කට බද්දට ගෙන ඇත. 2009 නොවැම්බර් මාසයේදී බැංකුව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී බැංකුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට යාබදව පිහිටි පර්චස් 106.69 ක ඉඩමේ අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සඳහා බද්දට ගත් ඉඩම ලබා දී ඇත. මේ හේතුව නිසා එදා සිට මේ දක්වා බද්දට ගත් ඉඩමේ බැංකුව කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක නිරත වී නැත. කෙසේ වෙතත්, ඉහත කී ඉඩමේ අනවසර පදිංචිකරුවන්ට 2020 දී වෙනත් ස්ථානයක නිවාස ලබා දී ඇති අතර, ඉදිකිරීම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නිෂ්කාශන තවමත් ලබා දී නොමැත. කළමනාකාරිත්වය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට තීරණය කර ඇති අතර, ඒ සඳහා ඔවුන්ගේ පැත්තෙන් සිදුවන ඕනෑම බාධාවක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ලිඛිතව දැනුම් දී ඇත.	නිෂ්කාර්ය වත්කම් ඵලදායී අරමුණු සඳහා භාවිතා කළ යුතුය.

ආ)	2019 ජූනි මාසයේ සිට පිටකොටුව ශාඛාවේ ප්‍රයෝජනය සඳහා මහල් 4 කින් යුත් ගොඩනැගිල්ලක් බැංකුව කුලියට ගෙන තිබුණද, එම ගොඩනැගිල්ලේ වර්ග අඩි 4,629 ක විශාලත්වයෙන් යුත් තට්ටු දෙකක් භාවිතයට නොගෙන අක්‍රියව පවතී. 2025 මැයි දක්වා කුලී වියදම් ලෙස බැංකුව රු. මිලියන 115.2 ගෙවා තිබුණි.	2025 දෙසැම්බර් මස අවසන් වන විට පිටකොටුව ශාඛාව කොළඹ 11, මල්වත්ත පාරේ වඩාත් සුදුසු ස්ථානයකට ගෙනයාම සඳහා බැංකුව විසින් පෙර ගොඩනැගිලි හිමිකරු (බොරැල්ල ද බිෂොප් හවුස්) සමඟ දිගුකාලීන කල්බදු ගිවිසුමකට එළඹ ඇත. එබැවින්, අනාගතයේදී බැංකු ශාඛාව එම පරිශ්‍රයේ ක්‍රියාත්මක නොවනු ඇත.	නිෂ්කාර්ය වත්කම් ඵලදායී අරමුණු සඳහා භාවිතා කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
අ)	2024 නොවැම්බර් 25 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කර ඇති පරිදි, 2025 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, "ශ්‍රී ලංකාවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2024" මගින්, "ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2006" ප්‍රතිස්ථාපනය කර අවලංගු කර ඇතත්, නව මාර්ගෝපදේශවලට අනුකූලව එහි පවතින ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට බැංකුව තවමත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.	මේ වන විට බැංකුව නව චක්‍රලේඛය සඳහා අවශ්‍ය අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාගෙන ඇති අතර නව ප්‍රතිපත්තියට අනුව ප්‍රසම්පාදනය සිදු කරනු ලැබේ.	"ශ්‍රී ලංකාවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2024" සමඟ පූර්ණ අනුකූලතාවයක් සහතික කිරීම සඳහා බැංකුව එහි පවතින ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය සමාලෝචනය කර යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය.
ආ)	රජය විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පිළිවෙත් භාවිතය ප්‍රවර්ධනය කරමින් සිටින අතර, අනෙකුත් රාජ්‍ය බැංකු ද ඔවුන්ගේ ප්‍රසම්පාදන වලදී ඒවා ක්‍රියාත්මක කරන නමුත්, බැංකුව මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති PROMISE.lk ද්වාරය භාවිතා කරමින් විද්‍යුත් ප්‍රසම්පාදනය ආරම්භ කර නොතිබුණි.	බැංකුව දැනට Oracle ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය භාවිතා කරන බැවින්, Promis.lk ද්වාරය භාවිතා කර නොමැත. කෙසේ වෙතත්, තවදුරටත් සංශෝධන සමඟ Oracle ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය සමඟ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත Promis.lk හරහා විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පිළිවෙත් අනුගමනය කිරීම වේගවත් කිරීමට බැංකුව අදහස් කරයි.	PROMISE.lk ද්වාරය ලියාපදිංචි කර භාවිතා කිරීමෙන් බැංකුව ඉ-රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතුය.
ඇ)	"Fusion Procure to Pay" ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රසම්පාදන ලිපිගොනුව පරීක්ෂා කිරීමේදී, පහත නිරීක්ෂණ සිදු කරන ලදී;		
	i) KPMG සමඟ අදාළ සේවාවන් සැපයීම සඳහා වූ ගිවිසුම 2025 මැයි 5	තවමත් සංවර්ධනය කළ යුතු ඇතැම් වාර්තාවල අසම්පූර්ණ බව	අදාළ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන

වන දින කල් ඉකුත් වී ඇතත්, බැංකුව සඳහා මෙහෙයුම් සහ ව්‍යාපාර අඛණ්ඩතා අවදානමක් ඇති කරමින් ගිවිසුම අලුත් කිරීමට හෝ ප්‍රතිස්ථාපනය කිරීමට බැංකුව කිසිදු කාලෝචිත ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ සමඟ, ඉන්වෙන්ට්‍රි කළමනාකරණය සහ ප්‍රසම්පාදන කාර්යයන් වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් ප්‍රමාද වී අතින් සිදු කර තිබුණි.	හේතුවෙන් ගිවිසුම අලුත් කිරීමට නොහැකි විය. අවශ්‍ය කටයුතු සම්පූර්ණ කිරීමට සහ එම වෙළඳ ආයතනය සමඟම ගිවිසුම අලුත් කිරීමට තවදුරටත් සාකච්ඡා සිදුවෙමින් පවතී.	යාම සහතික කිරීම සඳහා බැංකුව ගිවිසුම අලුත් කිරීමට වහාම පියවර ගත යුතුය. තවද, කොන්ත්‍රාත් කාල නියමයන් නිරීක්ෂණය කිරීමට සහ කල් ඉකුත් වීමේ දිනයන්ට පෙර අලුත් කිරීමේ හෝ ප්‍රතිස්ථාපන ක්‍රියාවලීන් ආරම්භ කිරීමට සුදුසු පියවර ස්ථාපිත කළ යුතුය.
ii) ප්‍රසම්පාදන පද්ධතිය මඟින් අවශ්‍ය සියලුම ක්‍රියාකාරීත්වයන් ලබා නොදෙන බවත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී පරිශීලක අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් මෙහෙයුම් සුමටව ක්‍රියාත්මක කිරීමට බාධා කරන සීමිත විකල්ප පමණක් ඇති බවත් නිරීක්ෂණය විය. උදාහරණයක් ලෙස, තොග කළමනාකරණයේදී යළි ඇණවුම් කිරීමේ මට්ටම සහ ඇතුල්වීම-පිටවීම මාරු කිරීම සඳහා අංග පද්ධතිය සතුව නොපැවතුණි. මෙය මෙහෙයුම් අකාර්යක්ෂමතාවයට, පරිශීලක අතෘප්තියට සහ බැංකුවට නිෂ්ඵල ආයෝජන වලට හේතු වී තිබේ.	බැංකුවේ අවශ්‍යතාවය සම්පූර්ණ කරන තෙක් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 20 ක් බැංකුව විසින් රඳවා ගන්නා ලදී. ඉතිරි ගැටළු විසඳීම සඳහා KPMG සමඟ සාකච්ඡා පැවැත්වෙමින් පවතී.	මුල් මෙහෙයුම් අවශ්‍යතාවලට සාපේක්ෂව නිශ්චිත ක්‍රියාකාරී පරතරයන් හඳුනා ගැනීම සඳහා බැංකුව විසින් ප්‍රසම්පාදන පද්ධතිය පිළිබඳ පුළුල් සමාලෝචනයක් පැවැත්විය යුතුය. පවතින පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා නිවැරදි කිරීමේ පියවරයන් ගත යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	2025 මැයි 31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද බැංකුවේ සේවක සංඛ්‍යාව 4,095 ක් වූ අතර කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව 26 ක් සමග සත්‍ය සේවක සංඛ්‍යාව 4,221 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. i) විධායක මට්ටමේ සේවක සංඛ්‍යාව වූ 850 න් 267 ක් 2025 මැයි 31 දිනට පුරප්පාඩු වී තිබුණි. ii) 2024 මාර්තු 22 වන දින පැවති එහි රැස්වීමේදී මණ්ඩලය විසින් I ශ්‍රේණියේ සිට VI ශ්‍රේණිය දක්වා පමණක් සේවක	2025 මැයි 31 වන විට අනුමත සේවක සංඛ්‍යාව 4095 ක් වන අතර ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ කාර්ය මණ්ඩලය ඇතුළුව සැබෑ ස්ථිර සේවක සංඛ්‍යාව 4221 ක් වන අතර කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය 26 කි. i. III-II ශ්‍රේණියේ සහ ඉහළ, සේවක සංඛ්‍යාවේ 850 ක තනතුරු අතරින් 2025 මැයි 31 දින වන විට පුරප්පාඩු වූ තනතුරු 267 ක් හඳුනාගෙන ඇත. එම තනතුරු පහත පරිදි පුරවන ලදී.	සියලුම ශ්‍රේණි සහ කාණ්ඩ හරහා සත්‍ය කාර්ය මණ්ඩල අවශ්‍යතා පිළිබිඹු වන පරිදි අනුමත සේවක සංඛ්‍යා ව්‍යුහය විධිමත් ලෙස සමාලෝචනය කර යාවත්කාලීන කරන බවට බැංකුව සහතික විය යුතුය. තවද, පවතින පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

	සංඛ්‍යාව අනුමත කර ඇති අතර, සුළු කාර්ය මණ්ඩලය 595 ක් සහ ලඝුලේඛක /රහස්‍ය ලේකම් /යතුරු ලියන 149 දෙනෙකු 2024 වර්ෂයේදී අනුමත සේවක සංඛ්‍යාවට නොගෙන, යම් ධාරාවක් වෙනස් වනතුරු, උසස්වීම් සම්පූර්ණ කරන තෙක් සහ මූලික බැංකුකරණය ක්‍රියාත්මක කරන තෙක් අතුරු පියවරක් ලෙස අනුමත කර ඇත. කෙසේ වෙතත්, මෙම කාණ්ඩ 02 2022 වර්ෂයේදී අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර තිබුණි.	III-II ශ්‍රේණියේ (සහකාර කළමනාකරු) උසස්වීම් 220 ක් සඳහා ප්‍රදානය කර ඇත. බැංකු හා බැංකු නොවන කාර්ය මණ්ඩල 21 දෙනෙකුට I ශ්‍රේණියේ (ප්‍රධාන කළමනාකරු) උසස්වීම් ලබා දී ඇත. බැංකු හා බැංකු නොවන කාර්ය මණ්ඩල - II ශ්‍රේණියේ (ජ්‍යෙෂ්ඨ කළමනාකරු) උසස්වීම් සඳහා සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇත. III-I ශ්‍රේණියේ උසස්වීම් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. තවද, 2024 අනුමත ව්‍යුහයට අනුව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් සහ ශාඛා බැංකු) තනතුර සඳහා අයදුම්පත් කැඳවන ලදී. මහ බැංකුවෙන් සුදුසුකම් සහ යෝග්‍යතා අනුමැතිය ලැබීමට යටත්ව උසස්වීම් දැනටමත් ලබා දී ඇත. දිවුරුම් ප්‍රකාශ සහ ප්‍රකාශ දැනටමත් ඉදිරිපත් කර ඇත.	
ආ)	මානව සම්පත් අංශය විසින් පිළිවෙලින් 2011 සැප්තැම්බර් සහ 2016 අප්‍රේල් මාසවලදී පවත්වන ලද මූලික විනය පරීක්ෂණයකින් සහ විධිමත් විනය පරීක්ෂණයකින් පසුව, බදුල්ල ශාඛාවට අනුයුක්තව සේවය කළ (III-III ශ්‍රේණියේ) නිලධාරියෙකු 2013 මාර්තු 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් පහ කර තිබුණි. බැංකුවේ විනය නීති සංග්‍රහයේ "අ" උපවගන්තිය යටතේ බරපතල වංචා හතරක් සහ "ආ" උපවගන්තිය යටතේ වංචා පහක් සිදු කිරීම හේතුවෙන් සේවයෙන් පහ කිරීමට සිදුවිය. මෙම වංචාවලට ගනුදෙනුකරුවන්ගේ තොරතුරු බාහිර පාර්ශවයන්ට අනවසරයෙන් හෙළිදරව් කිරීම සහ එම ගනුදෙනුකරුවන්ගෙන් ස්ථාවර තැන්පතු එකතු කිරීම ඇතුළත් විය. කෙසේ වෙතත්, නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයකින් පසුව, විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලද අතර, 2017 ඔක්තෝබර් 19 වන දින සිට බලපැවැත්වෙන පරිදි	බදුල්ල ශාඛාවේ සේවය කරමින් සිටියදී පුද්ගලික ව්‍යාපාරික අරමුණු සඳහා ගනුදෙනුකරුවන් පොළඹවා ගැනීම සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයකින් පසුව ඔප්පු වූ චෝදනා හතරක් මත පදනම්ව එස්.එන්. පියදාස මහතා 2013 මාර්තු 21 දින සිට බැංකුවේ සේවයෙන් පහ කර ඇත. පියදාස මහතා විසින් කරන ලද අභියාචනයකින් පසුව, බැංකුවේ විනය සංග්‍රහයට අනුව අභියාචනා අධිකාරිය ලෙස මණ්ඩලය නඩුව නැවත විභාග කිරීමට තීරණය කර ඇත. ඉන්පසු දෙවන විනය පරීක්ෂණයේදී පියදාස මහතා සියලු චෝදනාවලින් නිදහස් කරන ලද අතර, එබැවින්, නීති උපදෙස් ලබා ගැනීමෙන් පසු, 2020 ඔක්තෝබර් 08 දින පැවති රැස්වීමේදී මණ්ඩලය ඔහුව නැවත බැංකුවේ සේවයේ පිහිටුවීමට තීරණය කළේය. මේ අතර, එස්. සුබානන්දන් මහතා	නිලධාරියා විසින් සිදු කරන ලද වංචනික ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වූ පාඩු පියවා ගැනීම සඳහා බැංකුව වහාම නීතිමය සහ පරිපාලනමය ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතුය.

වංචා චෝදනා නවයෙන් නිලධාරියා නිදහස් කර තිබුණි. පසුව, 2020 ඔක්තෝබර් 8 වන දින, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම නිලධාරියා මුහුණ දෙන ආර්ථික දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් නැවත සේවයේ පිහිටුවීම අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, මෙම නැවත සේවයේ පිහිටුවීමේ තීරණය ගන්නා අවස්ථාව වන විට, එම නිලධාරියා බදුල්ල ශාඛාවේ උකස් නිලධාරියා ලෙස සේවය කරමින් වගකීම් විරහිතව සහ නොසැලකිලිමත් ලෙස කටයුතු කරමින් තවත් වංචාවක් සිදු කර තිබුණි. නිලධාරියා විසින් සිදු කරන ලද බරපතල වංචනික ක්‍රියාකාරකම් හේතුවෙන් බැංකුවට රුපියල් මිලියන 6.835 ක අලාභයක් සිදුවී තිබුණි. නිලධාරියා 2023 ඔක්තෝබර් 31 වන දින බැංකුවෙන් විශ්‍රාම ගියද, 2025 ජුනි 30 වන දින වන විට එම පාඩු අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, අදාළ රක්ෂණ හිමිකම් පෑම ද ප්‍රතික්ෂේප කර තිබුණි.

විසින් සිදු කරන ලද උකස් වංචාවක් සම්බන්ධයෙන්, බදුල්ල ශාඛාවේ සේවය කළ කාලය තුළ සිදු කළ නොසැලකිලිමත්කම

සම්බන්ධයෙන් පියදාස මහතාට තවත් චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත (මෙම නඩුවේ ප්‍රධාන චූදිතයා පියදාස මහතා නොවේ).

එම උකස් වංචාව සම්බන්ධයෙන් විනය පරීක්ෂණය 2017 අගෝස්තු 28 සිට 2019 පෙබරවාරි 06 දක්වා පවත්වා ඇති අතර, පසුව වැටුප් වර්ධක කල් දැමීමේ දඬුවමක් පියදාස මහතාට පනවා ඇත.

මෙම සිදුවීමේ හිමිකම් පෑම රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර ඇත. කෙසේවෙතත්, වන්දි ගෙවීම (Ex-gracia payment) මගින් රුපියල් මිලියන 2.5 ක් අනුමත කර ඇති අතර ප්‍රධාන විත්තිකරුට අදාළ අධිකරණ නඩුව අවසන් වන තෙක් එය අයකර ගැනීම අත්හිටුවා ඇත. ප්‍රධාන විත්තිකරු වන සුබානාදන් මහතා සම්බන්ධයෙන් බදුල්ල මහාධිකරණයේ අංක 37/2021 සහ 62/2022 දරන නඩු සමථයකට පත් කිරීමට කළමනාකාරිත්වය එකඟ වී ඇති අතර, බැංකුවට සිදු වූ පාඩුව පහත පරිදි අයකර ගැනීමට කටයුතු කර ඇත.

නඩු අංක 62/2022 හි රු. 6,473,750.00 ක පියවීම සඳහා මාස දෙකකට වරක් රු. මිලියන 1.5 ක් පිළිගැනීමට.

නඩු අංක 37/2021 හි රු. 6,834,500.00 ක පියවීම සඳහා මාස දෙකකට වරක් රු. මිලියන 1.5 ක් පිළිගැනීමට. ඒ අනුව, සුබානාදන් මහතා එම බේරුම්කරණයට එකඟ වී ඇති අතර, ඔහු දැනටමත් 2025 මැයි, ජූලි සහ සැප්තැම්බර් මාසවලදී රු. මිලියන 1.5 ක වාරික 3 ක් බැංකුවේ අවිනිශ්චිත ගිණුම් ණයහිමියෝ හි බැර කර ඇත.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අභ්‍යන්තර විගණන අංශයේ අනුමත සේවක සංඛ්‍යාව සේවකයින් 64 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව සේවකයින් 40 ක් පමණක් විය. ඒ අනුව, විධායක ශ්‍රේණියේ තනතුරු 23 ක් ඇතුළුව පුරප්පාඩු තනතුරු 25 ක් සහ අතිරික්ත තනතුරක් නිරීක්ෂණය විය.	අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු පිරවීම සඳහා විධායක - විගණන තනතුරු සඳහා නව බඳවා ගැනීම් 5 ක්, සහකාර කළමනාකරු - විගණන තනතුර සඳහා නව බඳවා ගැනීම් 4 ක් සහ සහකාර කළමනාකරු - තොරතුරු පද්ධති විගණන තනතුර සඳහා එක් බඳවා ගැනීමක් සිදු කරන ලදී.	අභ්‍යන්තර විගණන කාර්යයන් සුමටව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව සහ අවශ්‍ය තනතුරු දරන බවට බැංකුව සහතික විය යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍රවලට අදාළව බැංකුවේ තථ්‍ය කාර්යසාධනය සහ අයවැයගත සංඛ්‍යාලේඛන අතර සංසන්දනයක් පහත දැක්වේ. (පහත වගුව බලන්න)	සටහන් කර ඇත. ගාස්තු සහ කොමිස් ආදායම- මූලික බැංකු පද්ධතිය හරහා සේවා ගාස්තු එකතු කිරීම විධිමත් කර ඇත. හානිකරණ ගාස්තු - ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව, 2024 දී මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රුපියල් මිලියන 4,602 ක සඳහා බැංකුව විසින් අතිරේක හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කරන ලදී. වෙනත් වත්කම්- අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අයවැයේදී සලකා නොබලන මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ජොෂ්‍ය	අනාගත තොරතුරු මත අත් කරගත හැකි ඉලක්ක ඇතුළත් කර ගනිමින්, අයවැය තාර්කික පදනමක් මත අයවැය සකස් කළ යුතුය.

විස්තරය	තථ්‍ය (රු.'000)	අයවැයගත (රු.'000)	හිතකර/ (අහිතකර) (රු.'000)	ප්‍රතිශතය
ගාස්තු හා කොමිස් ආදායම	2,078,830	1,652,316	426,514	25.81 %
හානිකරණ ගාස්තු	11,206,056	5,010,951	6,195,105	123.63%
වෙනත් වත්කම් වගකීම්	50,002,248	70,392,919	(20,390,671)	(28.96%)
බැංකු වෙත	487,521	73,880	413,641	559.88%
වෙනත් ණයගැනුම්කරුවන් වෙත	48,190,057	162,716,712	(114,526,655)	(70.38%)
වෙනත් වගකීම්	9,002,109	27,059,195	(18,057,086)	(66.73)%
වෙනත් සංචිත	52,285,433	72,630,661	(20,345,228)	(28.01)%

පුරවැසි තැන්පතු සහ අක්‍රිය ලැබිය යුතු මුදල් ලැබීමයි.
බැංකු වෙත- තථ්‍ය තත්ත්වය තුළ බැංකුවලින් කෙටිකාලීන ණය ගැනීම් වැඩි විය.
වෙනත් ණයගනුදෙනුකරුවන් වෙත- අයවැය සංඛ්‍යාවට බැංකුවලින් ලබාගත් ප්‍රතිමිලදී ගැනීමේ ණය ඇතුළත් වන අතර, තථ්‍ය ණය සඳහා බැංකුවලින් ලබාගත් ප්‍රතිමිලදී ගැනීමේ ණය වලින් කිසිදු ශේෂයක් නොමැත.
වෙනත් වගකීම් අනෙකුත් වගකීම්වල අයවැය සංඛ්‍යාවට විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ඇතුළත් වන අතර එය තථ්‍ය සංඛ්‍යාවට ඇතුළත් නොවේ.
වෙනත් සංචිත අයවැය අගයට වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත/ රඳවා ගත් ඉපැයීම් සහ අනෙකුත් සංචිතවල එකතුවකින් සැදී ඇත. තථ්‍ය අගයට ඇතුළත් වන්නේ අනෙකුත් සංචිත පමණි.